දැන් බනින අය අනාගතයේ මට හොඳ කියයි P 05


THE CHATHAM STREET JOURNAL

Trust your source. Trust your decisions. https://csj.lk/ 2024|01|07 Vol: 67



## කයිවාරු හැර වමට කිසිවක් බෑ

P 04




## VAT නැති වුණා නම් ලැට්වලිනුත් වැඩක් නැහැ

# රනිල්ද? අනුරද? දෙකෙන් එකයි!

P 02



## බදු ගැන වටේ යන්නෙ නැතුව කෙළින් කතා කරන්න

P 03

## මරුම බඩු තුනක්!

P 04



P 09





# වමටද දකුණටද වැඩේ කරන්න පුළුවන්?



"රනිල් නැත්නම් අනුර, අනිත් ඔක්කොම සෙවල" අපි මෙහෙම ලිව්වා කළින්.

මේ කතාව මුලින්ම කිව්වෙ ලාල් කාන්ත, පොඩ්ඩක් වෙනස් විදිහට,

"අනුර නැත්නම් රනිල් අනිත් ඔක්කොම සෙවල" කියලා.

මේක ලාල්, වාචාලකමට කියපු කතාවක් විදිහට ගන්න ඕන නැහැ. මේ කතාවේ දේශපාලන ගැඹුරක් තියෙනවා.

ලංකාවේ හැමදාම වම සහ දකුණ කියල කඳවුරු දෙකක් තිබුණා. වම කිව්වට ඒක කාල් මාක්ස්ගෙ වම නෙමේ. ඒක බණ්ඩාරනායකත් එක්ක වම එකතුවෙලා හදපු වාම ජාතිකවාදී කඳවුර. සිරිමාවෝ එක්කත් හැදුනෙ එහෙම එකක්.

ඒ වගේම ඩී.එස්.ලා, ජේ.ආර්.ලා නියෝජනේ කළේ දකුණ. මේ වම දකුණ බෙදීම රාජපක්ෂ යුගයේදී බොඳවෙලා ගියා. ඒක යුද්ධයත් එක්ක ආපු විශේෂ තත්වයක්.

මේ කඳවුරු දෙකේ ඡන්දවලට අමතරව ලංකාවේ, මේ කඳවුරු දෙකටම අයිති නැති පාවෙන ඡන්ද කොටසකුත් නැතුව නෙමේ. ඒ ගොඩ දැන් මුළු ඡන්දවලින් 1/3ක් වගේ වෙලා. මේව සාම්ප්‍රදායික කඳවුරු දෙකට ගැති නෑ කියන එකේ අදහස හෙන සීරියස් තර්කානුකූල තීරණ ගන්නව කියන එක නෙමේ. ඇත්තටම තීරණයක් නෑ හෝ ඒ වෙලාවේ රැල්ලට තීරණ ගන්නව කියන එක.

මේ සාම්ප්‍රදායික ගොඩවල් දෙකේ ඡන්ද එහෙ මෙහෙ වෙන්නේ ඒ ගොඩවල් ඇතුළෙමයි. ගෝඨාභය 69 ලක්ශයක් ගනිද්දි ජවිපෙ ලක්ෂ හතරට බහින්නෙත් ගෝඨා රැල්ල බහින කොට ජවිපෙ රැල්ල නගින්නෙත් ඒකයි.

ඒ වගේම සජබෙ උඩ එනකොට යූ.එන්.පී. එක බහින්නෙත්, දැන් සජබ පල්ලම් බහින කොට යූ.එන්.පී. එක නගින්නෙත් ඒකයි.

දැන් වමේ ජාතිකවාදී ගොඩ අල්ලන් ඉන්නේ අනුර. අනුර ඒකෙ අයිතිකාරය වෙලා ඉවරයි. වෙන කවුරු ට්‍රයි කළත් මේ වෙලාවේ අනුරගෙන් ඒක ගන්න බෑ. ඒත් අනුර කෙළින් කියන්න ඕන එයා වමේ කඳවුරේ නායකයා කියලා. වටේ යන්න බෑ.

එතකොට දකුණ...,

දකුණෙ ඉන්න හොඳම අශ්වයා රනිල්. රනිල් තමයි, ජේ.ආර්. කළේ කොහොමද දන්නේ..., ප්‍රේමදාසට වැරදුණේ කොතැනද දන්නෙ..., චන්ද්‍රිකා මැද යන්න ගිහින් වැටුණ හැටි දන්නේ..., ඒ නිසා දකුණ ගැන රනිල් තරම් දන්න කෙනෙක් නෑ. රට බංකොලොත් වෙලා තියෙද්දි ඕක නෙමේ පාර, මේක කියල අරන්, කෙළින්ම දකුණෙන් ගිහින් වැල් පාලමෙන් රට එගොඩ කළේ රනිල්. ඒ නිසා රනිල් හැර වෙන කවුරුත් නායකයෙක් දකුණට නෑ.


ඉතින් රට ගොඩදාන්න පුළුවන් වමට ද දකුණට ද කියන ප්‍රශ්නයම තමයි, දැන් රට ඉස්සරහා තියෙන ප්‍රශ්නය. රනිල්ද? අනුරද? කියලා සරළ වෙන්නෙත් ඒ ප්‍රශ්නයමයි.

ඒ නිසා වෙන කවුරුත් නෑ...,

රනිල් නැත්නම් අනුර...

දකුණ නැත්නම් වම...

ඒ නිසා දැන් තියෙන්නේ වැඩේ කරන්න පුළුවන් වමටද දකුණටද කියල විවාද කරන එක.




## ඩාම් වෙන ඩූම් වෙන කලටිපොල්

පාටිය සැරටම යයි. සයිමා සහ ඩප්පියා සිටින ටේබල් එකට නුදුරින් වාඩි වී තොල් මතුරමින් ඉන්නේ ජීඇල් ය. ඊට නුදුරින් මේසයක පත කයියකට සෙට් වී සිටින්නේ ගොඩවාය. අනෙක් මේසයේ ඩලාය. ඩලාට අල්ලපු මේසයේ චම්පිය. මේස වටා ආවතේව සපිරි ආවතේවකරුවන්ය. මේ අසලට කිට්ටුවෙන්න බැරි තරම් පිරිස් ගැවසී ගත්තේය.

"යැක්කද සයිමා කොහොමද? විස්තීරණ වටපිටාවක මේ වගේ මුණ ගැසීම ඉතාම සතුටක් ඉතිං හමුවෙන්න කියල හිටියාට අපිට බැරි වුනා නේ මොකද මේ වෙනස ගැන කියන්නේ මිත්‍රයා." ජීඇල් සයිමාගේ මේසේට පහත් වී ඇසුවේය. සයිමා නිකමට හරි මේකා උගතෙක් නේ කියල අල්ලපු පුටුව ළඟට ගියේය.

"මේකයි ජීඇල් සර්. ඔබතුමාට ඉතිං මේ ලැබුණු චාන්ස් එක ගන්න කොහේ කොතැන හිටියත් කමක් නෑ කියලයි මට හිතෙන්නේ. පැත්ත මාරු වුණාට චාන්ස් කියන්නේ ඉතිං ලැබුණොත් ලැබුණා නැති වුනොත් නැති වුණා නේ. ඒ නිසා මහජනතාවට නම් ගානක් නෑ, හැබැයි මට නම් හිතෙන්නේ පාර්ලිමෙන්ට් සීට් එකක් කියන්නේ රටේ ජනතාවගේ මාර මෙව්වා එකක්. ඒක නාස්ති වෙන එක නම් අපරාධයක්"

"ආන්න සයිමාට තේරුණා ඒක නේ මම මේ පැත්ත මාරු කළේ මට ඕනේ ජනතාවට සේවය කරන්න නේ. දැන් මේ ව්‍යවස්ථාපිත භාවයන් රැකෙන එක තරම් මේ ජනතාවට දැනෙන ලොකු ප්‍රශ්නයක් නේහ් නැද්ද මං අහන්නේ"

"නැතිව නැතිව මිනිස්සුන්ට මාර ප්‍රශ්නයක් තමයි තියෙන්නේ මේ ව්‍යවස්ථාපිත දේවල් ගැන" ඩප්පියා ඇඟට පතට නොදැනී කියාගෙන ගියේය.

"ආහ් මේ සයිමා නේ කෝමද කාලෙකින්" ඒ ගොඩවාය.

"ඔබතුමා දැන් ජෝෂ්ඨ උපදේශක නේද? අපේ පුතාණන් සර්ගේ, අනේ වාසනාවන් මේ චාන්ස් එක ගත්තු එක නැත්නම් ඔබතුමාගේ සේවය අපිට නැතිව යනවා" සයිමා මූනිච්ඡාවට වගේ කියූ දේ ගොඩවායාට තේරුණේ නැත.

"ඔව් නේ සයිමා බලන්න මේ දැනුම වියත් බව යූස් කරන්න මේ රටේ කාටවත් බෑ. ඒ අතින් වියතුන්ට ගරුත්වයක් ඇති තැනකට පැනීම මට නම් සන්තෝෂමත් කාරණාවක්"

"නැතිව නැතිව ඔබතුමාලා කොපමණ කාර්යයක් කළාද මේ වියත් මගෙන් ඇවිත්, චරිතෙ හොඳ දේවගැතිවරයෙක් වෙච්චි ඔබතුමාගේ සේවය පුදුම තරම් මේ රටේ ජනතාව ඉල්ලා සිටිනවා. අනෙක අර නැව් කේස්වලදී ඔබතුමා දැක්වූ කාර්යය ශූරත්වයේ වාග් විලාසයන් ජනතාව කොච්චර උනන්දුවෙන් බලන් හිටියාද?" සයිමා එසේ කියත්ම ඩප්පියාද මැද්දට පැන්නේය.

"නැත්තන් නැත්තන් නැව් ගිලෙද්දී ඒවා ගොඩ ගන්න නැව්වලට පනින එකත් වෙන වියත් බවක් තමයි. හැබැයි සීන් එකකියන්නේ සැර්. ගිලෙන බව දැන දැන නගින එකේ අවුල තමයි."

"පිස්සුද බං අපි නැව ගිලුනත් බැන් චූන් මිනිස්සු නේ බං. ඔය කොයි නැවත් රටට වැඩ දායක නැවක්" ගොඩවායා කියද්දී නක්කලේට වගේ හිනාවක් ආවේ ඩප්පියාටය.

සයිමා පුටුවෙන් නැගිට පැත්තකට වෙන්නට හදද්දීම කොට ඩැල් එක්ක ඇවිත් කොන්දට තට්ටුවක් දැම්මේය.

"ආහ් මේ අපේ ඩලස්තුමා නේ. මොකද ප්‍රසිඩන්ට් ඉලෙක්ෂන් එකට යනව කියල ආරංචියි, සැර් වගේ උදවිය ඉල්ලන්නම ඕනේ. නැතිව බෑනේ. හෙලිකොප්ටරේකින් හරි ගොඩ බහින එකයි හොද"

"පිස්සුද බං මොන හෙලිකොප්ටර්ද වීල් බැරෝවක්වත් නැතිව කෙලවිලා ඉන්නේ මේ"

"අයියූ සැර් මොකද අවුල් වෙලා වගේ එතකොට කොහොමද මේ සීන්වලට මූණ දෙන්නේ. ප්‍රසිඩන්ට් කෙනෙක් වෙනවා කියන්නේ සෙල්ලමක්යැ. ඔය සීන් කරගත්තු සන්ධානේ අරගෙන ගොඩ බහින එක තමයි ලොකුම දේ."

"මොන ගොඩ බැහීම්ද බං මුන් එක්ක එකතු වෙලා වැඩක් කරන්න බෑ. මතකයි නේ එක පාරක් මට පොලිටිකල් එකම එපා වෙලා ඇමරිකා ඇද්දේ. මං මේ පාර යන්න හදන්නේ ඉතියෝපියාවට ඉලෙක්ෂන් එකට. මොකද බං එහේ උන් හරි මං කවුද කියල තේරුම් ගනීවි එතකොට."

"ඇත්ත සැර් ඇත්ත ඒ වගේ රටක නම් චේකන්සි තියෙන්න පුළුවන් හැබැයි අවුලකට තියෙන්නේ දැන් ඒ රටවල්වල පවා මිනිස්සු පොඩ්ඩක් හැදිල කියල ආරංචියි. නරකද ආයෙමත් පොලිටිකල් ඉගෙන ගන්නම රටක් තෝරගත්තොත්" සයිමාට හිතට ආදේ බ්‍රේක් කර ගැනීමට නොහැකිව කියල දැම්මේය.

"හූ. හූ. ඒයි සයිමා අපි මෙහේ මේ පැත්තට එමුකෝ ඇයි අපිව පේන්නේ නැද්ද ආ." ඒ පුතණෝගේ පාටියේ සෙට් එකය.

"මේහ් සයිමයියා යමුද යන්න මේ සෙට් එකට අහු වුණොත් ඉවරයි." ඩප්පියා කිව්වාට සයිමා ඒ ආසන්නට ගොස් හමාරය. ගැලවිල්ලක් නොමැති බැවින් සයිමා සෙට් එකේ අයෙකු විසින් ඇඳ දෙනු ලැබූ පුටුවක වාඩි විය.

"කෝමද සයිමා තොරතුරු මේ අපි මේ සෙට් වෙලා කයිය ගැහුවේ මොනවද වෙන්නේ කියල බලන්න. එන පොට හොදත් නෑ බං පනින්න පැත්තකුත් නෑ. මේ මඟුලේ ඉඳල වැඩකුත් නෑ හොරුත් එක්ක නෑ කිව්වට අපේ මහ එකා ළඟට ගන්නේම නැව් ගිලපු උනුයි ඒ පැත්තෙන් මේ පැත්තට එන ලපයි සිපයි ටිකයි. රෙද්දක් ඇඳන් බං පාරේ බැහැල යන්න පුළුවනෑ මේ මඟුල් එක්ක ඉඳල"

"ඇයි එහෙම කියන්නේ පුතාණෝ සැර් ඔය තුමන්ලාට ප්ලේස් එක දෙනවා නේ ගතියට ඇයි කිව්වේ මං ළඟ කවුරුවත් ඔය වරදානවල යටත් වෙන්නේ නෑ කියල"

"රෙද්ද තමයි බං. යන්තන් අල්ලගෙන යනවා. අපිට වෙන්නේ බං දකුණත් නෑ වමත් නැති සීන් එකක්. ඇයි බං කොහේ කියල යන්නද? කලින් ලොක්කා ළඟ හිටියා නම් යන්තම් අල්ලගෙන යන්න තිබුණා දැන් ඒකත් නෑ නේ බං"

"වැඩේ කියන්නේ සැර්ලා. ඒ ලොක්කා කැමති නැත්තේ ඔය සීන් එකටම නේ"

"ඒ කිව්වේ"

"ඇයි සැර් යන්තන් අල්ලගෙන යන වැඩේට කැමති නෑ නේ කරනවා නම් හරියට. දැක්කා නේ අවුරුද්දයි ලොකේම කතාවෙන තැනට රට ලයින් කළා. ආයේ නෝ කතා නෝ සිනා."

"ඒක ඇත්ත බං අපි නොදැන නෙවෙයි නේ ඉතිං ඒ සීන් ගැන. මේ අවුලකට දැම්මෙ මේ පුතාණෝ ඒ පාර අපිව ගොඩ දාපු නිසානේ. නැත්නම් ඉතිං ලොක්කා කියන්නේ වෙනම බඩුවක් තමයි. ඔය වගේ පොරකට කරන්න බැරි දෙයක් නෑ මේ කවුරු මොනව කිව්වත්"

"හොදම දේ කියන්නද සැර්" ඩප්පියා මැදට පැන ටෝක්ස් කරන්නට ගත්තේය.

"මේකයි ලොක්කාගේ හැටිත් දන්නවා නම් ලොක්කා රටත් ගොඩ දැම්මා නම් ඉතිං කරන්න තියෙන්නේ. පරණ පව් සමා කරගෙන නමෝ විත්තියෙන් වැඩේට බහින එක. හැබැයි දැම්ම කලබල වෙලා බෑ. හෙමින් කරන වැඩ මෙව්වා." ඩප්පියා කිව්වේය.

"සිරාවට ඇත්ත සැර්. මේක ගොඩ දාන්න පුළුවන් එහෙම පොරකට මිසක් කයිය ගහල හෙන ගේම් ගහල අරගල කරල මේ වැඩේ කරන්න බෑ. හොඳම දේ තමයි ඒකට අපි සප් එක දෙන එක" එහෙම කියූ සයිමා පුටුවෙන් නැගිටිද්දීත් අසමගියේ සෙට් එක ලොක්කා ලොක්කා කියා මොන මොනවදෝ කියනවා ඇසුනි.

"යනව නම් යමු බං. දැන් මේ කරුමයෙන් නිදහස් වෙන්න. අන්න ඒකයි බුද්ධිමත් කම කියන්නේ"

වැඩේ දෙල් වී ඇති බව පාටියෙන්ම පැහැදිලි වූ නිසාම සක්සස් එකක් හිතේ තබාගෙන තවත් සක්සස් එකක් හිතේ තබාගෙන සයිමා එතැනින් තොලොංචි වී ගියේ ඩප්පියාගේ ආටාවේ නැඟ ගෙනය.

තව්තිසා

# බදු ගැන වටේ යන්නෙ නැතුව කෙළින් කතා කරන්න

දැන් දේශපාලන ක්ෂේත්‍රයේ උණුසුම තියෙන්නේ තවමත් ප්‍රකාශයට පත්වෙලා නැති, තවත් මාස හත අටකින් එහා පැවැත්වෙනු ඇතැයි බලාපොරොත්තු වෙන ජනාධිපතිවරණය ගැනය. රටේ අර්බුද, ආර්ථික ප්‍රශ්න සමාජ ප්‍රශ්න සියල්ලම මේ උණුසුමට යටවෙමින් යයි. දේශපාලකයෝ පහුගිය කාලයේ මොන මොනවා හෝ දොඩමින් කරමින් සිටියත් ඉදිරියේදී තමන්ගේ පිළ වෙන්න ඕන මොකක්ද කියන එක තෝරාගැනීම ගැන දැන් බරපතලව කල්පනා කරමින් තිබේ. මේ අනුව පහුගිය කාලයේ දේශපාලනය තුළ රැඟූ චරිත මාරුවීම් සිදුවිය හැකිය. හැඳුනා කියපු රැළි ආපසු චුත වී යනු දැකිය හැකිය. අලුත් රැළි මතුවිය හැකිය.

ඒ කෙසේ නමුත් වර්තමාන දේශපාලනය තුළ ගොඩනැගෙමින් තිබෙන්නේ පැහැදිලිවම පිල් දෙකකි. මේ දෙකෙන් එකකට ගාල්වීමට සියළු පාර්ශ්වලට සිදුවෙනු ඇත. අතර මැද වෙන විගඩම්වලට තැනක් නැත. මන්ද ඒ තත්වයන් මේ රට මුහුණ දෙමින් තිබෙන අර්බුද හමුවේ අනිවාර්ය කරතිබෙන නිසාය. එසේම මෙවර පුද්ගල සාධක, පක්ෂ, පාට, ජාතිය, ආගම වගේ දේවල අදාලත්වය ද ක්ෂයවෙමින් තිබේ. ඒ එසේ වන්නේ වත්මන් දේශපාලනය වම සහ දකුණ කියන මතවාදී කඳවුරු දෙකට බෙදී වෙන්වීම තීරණාත්මකවීම මතය. ඒ අනුව රටේ අනාගත දේශපාලන ආර්ථික සහ සමාජීය ජයග්‍රහණයන් හෝ පරාජයන් සිදු වන්නේ මෙම කඳවුරු දෙකෙන් බලය අත්පත් කරගන්නා කණ්ඩායම අනුවය.

අප නිරන්තරයෙන් මෙම පුවත්පත හරහා මෙම දේශපාලනික මතවාදී බෙදීම ගැන සහ එහි තීරණාත්මක බව ගැන කරුණු අණාවරණය කළෙමු. කෙසේ නමුත් මේ වම දකුණු ගැටුම යථාර්ථය වුවත් මේ අවධාරණය කිරීම විපක්ෂ කණ්ඩායම් විසින් හිතා මතා මඟහරින බවත් පෙනෙන්නට තිබේ. තමන්ගේ කඳවුර කුමක්ද යන්න හෙළිවීම තමන්ට වන අවාසියක් වෙනු ඇති බව ඔවුන් කල්පනා කරනවා විය හැකිය. මේ නිසා දේශපාලන මතවාදී පදනම සඟවමින් පටු ජනතාවාදී ජනප්‍රිය සටන් පාඨ මත යැපෙමින් කරන තක්කඩි දේශපාලනයක යෙදීම විපක්ෂය පෙන්වන දර්ශනය වී ඇත. විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වන සජබයත් මේ වන විට වඩා තීරණාත්මක බලපෑමක් සිදුකරනු ඇතැයි කියන ජවිපෙට අයත් ජාජබයත් මේ ජනප්‍රිය දේශපාලනයේ අගතැන්පත්ය. ඒ නිසාම ඔවුනොවුන් අතර ගෝත්‍රික පන්නයේ ගැටුමක්ද තිබේ. ඒ කෙසේ වෙතත් මේ ජනප්‍රිය දේශපාලනය නිසා ජනතාව නොමඟ ගොස් යළි දැවැන්ත අර්බුදයකට රට තල්ලු කිරීමේ ඉඩකඩක්ද නිර්මාණය වෙමින් තිබෙන බව පැහැදිලිය. නමුත් ඊට ඉඩක් ලබානොදීම වෙනුවෙන් දකුණේ කඳවුර පැහැදිලිවම තම ආස්ථානයේ පිහිටමින් ඍජු දේශපාලන ගමනක යෙදී සිටී. ඊට ජනාධිපති රනිල් වික්‍රමසිංහ නායකත්වය දෙයි. වාම කඳවුරට ජවිපෙ නායකත්වය දීමේ ශක්‍යතාවය පෙන්වා තිබුණද එය විසින් ජාජබය පෙරටුකරගත් ජනප්‍රිය දේශපාලනය තෝරාගැනීම නිසා ඒ කඳවුර දැන් වියවුලකය. මන්ද ජාජබය දකුණේ මතවාදයක් පෙන්වමින් පැළඳ සිටි වෙස් මුහුණ දැන් හෙළිදරව් වෙමින් පවතින නිසාය.

මේ දිනවල මේ අයගේ ලොකුම ආණ්ඩු විරෝධී සටන් පාඨය වී ඇත්තේ බදු ප්‍රශ්නයය. විශේෂයෙන්ම වැට් බදු නිසා ජන ජීවිතය විනාස වෙනවාය, අපි ආවොත් මේ බදු ඔක්කොම අයින් කරල ජනතාවට සහන පිට සහන දෙනවාය කියන සයිස් එකෙන් මේ දෙගොල්ලෝම ප්‍රචාරක වැඩේ කරමින් සිටී.

එහෙත් වැට් බද්ද ගැන මහා හා හූවක් විපක්ෂය විසින් ගෙන ගියද මේ බදු ඉවත් කිරීමෙන් කළ හැකි කිසිවක් නැති බව මේ අය හොඳාකාරවම දන්නවාට සැකයක් නැත. වැට් බදු සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත කිරීමට පෙර රාජ්‍ය මුදල් කාරක සභාවේ අනුමැතියට දමා තිබිණි. එහි සභාපතිවරයා වන්නේ විපක්ෂයේ හර්ෂ ද සිල්වාය. එමෙන්ම එහි තවත් විපක්ෂ මන්ත්‍රීවරු ගණනාවක්ද සාමාජිකයන් වෙයි. ඔවුන්ගේ සාකච්ඡාවෙන් නව වැට් බදු සංශෝධනය අනුමත කර තිබුණේ ඒ නිවැරදිම යෝජනාවක් වූ නිසාය. අමතර සංශෝධන කිහිපයක් යෝජනා වී තිබූ අතර ඒවා රජය විසින් පිළිගෙන තවදුරටත් පීඩනයන් ලිහිල් කිරීමේ පියවරයන් කිහිපයක්ද රජය ගෙන තිබිණි.

මේ අතර ජනතා විමුක්ති පෙරමුණද මේ වැට් බදු අල්ලාගෙන රජයට එරෙහි ප්‍රචාරක කටයුත්තක නියලෙමින් සිටී. විශේෂයෙන්ම සමාජ මාධ්‍ය තුළ එම සාමාජිකයන් හිතවතුන් විශාල ඝෝෂාවක් කරමින් සිටී. නමුත් මේ ජවිපෙ ජාතික ජන බලවේගයේ ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිකුත්කර තිබෙන ප්‍රතිපත්ති ප්‍රකාශනය විමසා බැලූ විට වත්මන් රජය ක්‍රියාත්මක කරන බදු ප්‍රතිපත්තිය, ජාතික ජන බලවේගය බලයට පැමිණීමෙන් පසුව ක්‍රියාත්මක කරනවාය කියන ප්‍රතිපත්තියට වෙනස් නැත. වත්මන් රජයේ ප්‍රතිපත්තියට පිටස්තර දෙයකට ඇත්තේ බදු අය කිරීම ගැන ගණන් හිලව්වල වෙනසකි. නමුත් එය වත්මන් රජයේ ගණන්හිලව් සමඟ සැසඳීමේදී අතිශය දරුණුය. එය ජනතාව පීඩාවෙන් නිදහස් කරනවා වෙනුවට තවදුරටත් පීඩාවට පත්කරන බව කිව යුතුය.

මෙහිදී එක් වගන්තියකින් කියවෙන්නේ රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 20-25ක් කරන බවය. මෙම සඳහන් කිරීමත් නිශ්චිත අගයකින් නොකිරීමෙන් මේ අයගේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විශ්වසනීයත්වය ඇති කරගැනීමේ හැකියාවද දුරස් කර තිබේ. මන්ද රාජ්‍ය ආදායම අච්චර මෙච්චර වැඩි කරනවා කිව්වද එහිදී මෙම ඉලක්කම්වල දශමස්ථානද අතිශය වැදගත්ය. 20ක් 25ක් කරනවා කියන ඉලකක්ම දෙක අතර ඇති පතරය රාජ්‍ය ආදයම සමඟ බැලීමේදී අති විශාල අගයකි. ආර්ථික අර්බුද සමයේදී මෙරට රාජ්‍ය ආදායම දළ දේශිය නිශ්පාදනයෙන් සියයට 8ක තරම් අඩු අගයක් දක්වා කඩා වැටී තිබිණි. ජනාධිපති රනිල් වික්‍රමසිංහ සිදු කළ ආර්ථික ප්‍රතිසංස්කරණවලින් අනතුරුව පසුගිය වසර අවසන් වන විට එය සියයට 11.2 දක්වා ඉහළ නංවා ගැනීමට සමත් විය. මේ සුළු ඉහළ නංවා ගැනීම වෙනුවෙන් ඔහු පසුගිය වසර එකහාමාර තුළ ලැබූ පැසසුමට වඩා ඔහුට ලැබුණේ විරෝධතා ගැරහුම් අවලාදයන්ය. විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණු සාමාජිකයන් හිවතුන් ඒ තමන්ගේ දෛනික රාජකාරියක් කරගෙන නිතිපතා ඔහුට පහර දුන්නේය. කොහොම නමුත් රජයේ මීළඟ ඉලකක්ය 2026 වන විට රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 15ක තරමටවත් රැගෙන ඒමය. තවත් සියයට 4කින් පමණ මෙම වැඩි කරගැනීමට වසර දෙකතුනක කාලයක් අවශ්‍ය බව රජයේ මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේද ගණන් බැලීමය. ඒ අනුව එය එතරම් පහසු නැති බව පැහැදිලිය. රජයේ ආදායම් කියන්නේ මුළුමනින්ම පාහේ බදු ආදායම්ය. බදු ආදායම් පුළුල් කරගැනීමේ දුෂ්කර බව නිසා ඒ වෙනුවෙන් වසර දෙකතුනක කාලයක් වැය කරමින් ජනතාවට පීඩාවන් අවම කරමින් සුක්ෂමව එය සිදු කළ යුතුව තිබෙන්නක් බව රජයේ අවබෝධයය.

එහෙත් ජාතික ජන බලවේගයේ පොරොන්දුව වන්නේ තමන්ගේ ජනාධිපති ලෙස අනුර කුමාර පත්කරගෙන දවසෙන් දෙකෙන් රාජ්‍ය ආදායම සියයට 20කට 25කට ගෙන ඒමටය. එහෙම විශ්මකර්ම වැඩක් කරන්න බැරිකමක් නැත. නමුත් එහිදී දැනට ක්‍රියාත්මක කෙරෙන බදු ආදායම් දෙතුන් ගුණයකින් වැඩි කරගැනීම අනිවාර්ය වෙයි. බදු ගන්න වෙන්නේ ජනතාවගෙනි. ඔවුන්ගේ පසුම්බියෙනි. ඒ අනුව ජනතාව මේවා කොහොම ඉවසාවිදැයි අපි දන්නේ නැත.

මේ අතරම මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන්ව ඇති තවත් කරුණක් වන්නේ ඍජු බදු හා වක්‍ර බදු අතර අනුපාතය 18යි, 82යි වන සේ තිබෙන පරතරය, 40යි 60යි බවට පත්කරන බවය. කොහොම නමුත් මේ වන විට මෙම අනුපාතය 30යි 70යි අතරට ගෙන ඒමට වත්මන් රජය සමත්ව ඇත. රජය මේ තැනට අනුපාත ගෙන ආවෙත් කලින් කිව් සේ කෙළවරක් නැති විරෝධතා අවලාද රැසක් සමඟය. ඍජු බදු කියන්නේ ආදායම් බදුය. පුද්ගලයන් විසින් ගෙවන ආදායම් බදු, උපයන විට බදු ආදිය සහ ව්‍යාපාරික ආයතනවල ආදායම අනුව අය කරන බදුය. වක්‍ර බදු යනු වැට් බදු ආදී පාරිභෝගික ජනතාව මත වැටෙන බදු වර්ග රැසකි. දැන් මෙම පරතරය පියවන්න නම් ඍජු බදු වැඩි කිරීම හෝ වක්‍ර බදු අඩු කිරීම හෝ විය යුතුය.

දැන් මෙම පරතරය පියවන්න ජවිපෙ පුද්ගලයන් මත බදු ව්‍යාපාරික ආයතන මත වන බදු ප්‍රතිශත වැඩි කිරීම සිදු නොකරනවා යැයි සිතුවොත් වැට් සහ එවැනි බදු විශාල වශයෙන් ලිහිල් කළ යුතුය. ගෝඨාභයගේ කාලයේ මෙහෙම දේවල් සිදු කරමින් කරගත් හරිය අමතක කළත් ජාජබයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන විදිහට ඉහත සඳහන් කළ පරිදි රාජ්‍ය ආදායම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 25කට ඉහළ නංවාලීමට අවශ්‍ය බදු එකතු කරගන්නේ කෙසේ ද යන ගැටලුව නිතැතින්ම මතුවේ. කොහොම නමුත් බදු කපා හැර බදු ආදායම් උපයන ක්‍රමය ජවිපෙ හැර වෙන කවුරුවත් දන්වාදැයි අපි දන්නේ නැත. ඍජු බදු වැඩි කිරීමට ජවිපෙ තින්දු කළහොත් වෙන්නේ ජවිපෙ පහුගිය කාලයේ රජයට එරෙහිව බදු සංශෝධන හකුලා ගනිව් කියා කළ වෘත්තිකයන්ගේ, වෘත්තීය සමිතිවල විරෝධතා, ව්‍යාපාරිකයන්ගේ විරෝධතා ඒ තිබුණාට වඩා විශාලව නැවත පැන නැඟීමය. එවිට අනුර කුමාරලාට එය මර්දනය කරන්න වෙන්නේ රනිල් එය යටපත් කළාට වඩා වැඩි බරක් යොදාගෙනය. ඒ කොහොම වුණත් ජවිපෙට මේ බදු අනුපාතයන් 40යි 60 ලෙස ගෙන ඒමට සහ රාජ්‍ය ආදායම සියයට 25ක් දක්වා වර්ධනය කිරීමට, අද තිබෙන බදු වැඩි කිරීම පමණක් නොව තවතවත් අලුත් බදු වර්ග තොගයක් ගැසීමට සිදුවන බව කිසිදු සැකයක් නැති දෙයකි.

බදු නැතිව වෙනත් ක්‍රමයකින් ආදායම් හොයනවා නම් කළ හැක්කේ රජය විසින් රාජ්‍ය ව්‍යාපාර කිරීම හරහා ආදායම් සොයා ගැනීමය. ඒ හරිය ගැන අමුතුවෙන් යමක් සටහන් කළ යුතු නැත. රජය තියෙන්නේ ව්‍යාපාර කරන්න නොවේය, යන්න ජාජබයේ ප්‍රතිපත්තිය බව ජවිපෙ නායකයෝ පසුගිය
දිනවල කියමින් සිටියහ. නමුත් යළි ඊයේ පෙරේදා කියවන්න ගත්තේ ඊට එරෙහි තමන්ගේ සුපුරුදු පැරණි වාමංශික මතයය. ජවිපෙ හෝ ජාජබය හෝ වේවා මේ අයගේ නිශ්චිත ප්‍රතිපත්තිය කුමක්ද යන්නවත් දැන් පැහැදිලි නැත. යන්නේ කොහෙද මල්ලේ පොල් කතා දැන් නිරන්තරයෙන් ඇසෙයි.

එමෙන්ම මේ දිනවල බදු ලියාපදංචි වීමේ අංකය නැතිනම් TIN අංකය ලබා දීම ගැනත් ජවිපෙ සාමාජිකයන් හා හිතවතුන් ඊට එරෙහි කටයුතු කරමින් තිබේ. නමුත් ජාජබයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වන්නේ TIN අංකයට වඩා එහා යෝජනාවකි. ඒ අනුව අවුරුදු 18 දී දෙන TIN අංකය වෙනුවට උප්පත්තියම අංකයක් දෙයි. එය සඳහන් වන්නේම බදු රැස් කරගැනීම වෙනුවෙන්ම එම අංකය දෙන බවය.

ඒ අනුව අද බදු ප්‍රතිසංස්කරණයට එරෙහිව විපක්ෂයේ හඬ නැඟීම මුළුමනින්ම ජනතාව රවටන නොමඟ යවන ජනතාවට වංචා කරන විපක්ෂයේ තවත් තක්කඩි මෙහෙයුමක් පමණක් බව පැහැදිලිය. බරපතලම දේ තමන් දෙපය තබාගෙන සිටින්නේ ඇත්තටම කොතනැද කියා
සැඟවීමය.

කෙසේ නමුත් මෙම අර්බුද සමය සහ ඊට ලබාදුන් විසඳුම් විසින් පුරවැසි ජනතාවට අලුත් බොහෝ දේ ඉගෙන ගැනීමේ හැකියාව ලැබී ඇත. ආර්ථික ප්‍රතිසංස්කරණ, බදු ගැසීම ආදිය ගැන විපක්ෂය කවර බොරුබේගල් සමාජගත කළද ඇත්ත ඇති සැටියෙන් තේරුම් ගැනීමට තරම් බහුතර ජනතාව දැන් දැනුවත්ය. විශේෂයෙන්ම රටකට අවශ්‍ය නායකත්වය කුමක්ද, තමන් භාරගත් රාජකාරියට වගවීම ගැන අද ජනාධිපතිවරයා පෙන්වා දී තිබෙන ආදර්ශය, හෙට දවසේ දී තම දුවා දරුවන්ට වගවීම කියන්නේ කුමක්ද යන්න ගැන ඉගැන්වීමට තරම් සුවිශේෂී වන නායකත්ව පෞර්ශයක්ව ද ඇත. එතරම්ම විවෘත්තව අවංකව ඔහු කටයුතු කරමින් ඇත. දකුණේ සැබෑ නායකත්වය එහෙමය. ඒ පිරිසිදුය.




සෝෂක

# මරුම බඩු තුනක්!



ඉතාම දුෂ්කර තත්වයන්ට මුහුණදුන් විට මිනිසුන් තීන්දු තීරණ ගනු ලබන්නේ හැඟීම්බරව බව රහසක් නොවේය. එතැන බුද්ධියට ලැබෙන්නේ පහළම තැනක්ය. රැ වැටුණු වළේ දහවලේදීත් වැටෙන්නේ එහෙම මිනිසුන්ය. එයින් ගැළවීම ඇත්තේ නොදැනුවත්ව හෝ වළක වැටුණු මිනිසුන් එය ශරීරයට විපත්තියක් වුවත් මොළයට ආයෝජනයක් කර ගතහොත් පමණය. එළඹෙන ජනාධිපතිවරණය කියන්නේද අන්න එහෙම වළක වැටීම මොළයට ආයෝජනයක් කරගත යුතු මොහොතක්ය. නමුත් ඉතාම සූක්ෂම ලෙස දැනටමත් වෙන්ඩ ජනපතිවරුන් පවතින ආර්ථික දුෂ්කරතාව හමුවේ ජනතා හැඟීම්වලට කතා කරන්න අරගෙනය. ඒ අන් කිසිවක් නිසා නොව දුෂ්කරම අවස්ථාවේ ජනතාව බුද්ධියට තැනදීම වළක්වාලන්නය. ඔවුන්ගේ වචන තොරණ ගලවා බැලුවිට ඇත්තේ රැ වළේ වැටුණු ජනතාව මහදවාලේ ද වළට දාන්න යන සූදානමකට වැඩි දෙයක් නොවේය.

මිලියන 22ක ජනතාවට සොහොන් ලකුණු පෙන්වන වෙන්ඩ ජනාධිපතිලා අතර ඉදිරියෙන්ම සිටින්නේ කෝටිපති ව්‍යාපාරික ධම්මික පෙරේරාය. මේ අතර පසුගියදා යුටියුබ් නාලිකාවක් සමඟ සම්මුඛ වූ රාජපක්ෂ පවුලේ ඥාතියකු වන උදයංග වීරතුංග කියා සිටියේ පොදු ජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂක ලෙස ධම්මික පෙරේරා ද අග්‍රාමාත්‍ය අපේක්ෂ ලෙස නාමල් ද නම් කරනු ඇති බවය. එසේම ජනාධිපතිවරණයෙන් පසුව ගාමිණී සෙනරත් ජනාධිපති ලේකම් ධුරයට පත්කරන බවද ඔහු කියා තිබිණ. ඒ කියන්නේ යළිත් වටයකින් රාජපක්ෂවරුන් බලයට ඉව අල්ලමින් සිටින බවය.

දේශපාලනය කවුරු කළත් එහි ඉලක්කය කෙසේ හෝ රාජ්‍ය බලය අත්පත් කරගැනීමය. ඒ වෙනුවෙන් වූ ශුද්ධ අයිතිය රාජපක්ෂවරුන්ටද ඇත. නමුත් ඒ සඳහා අවස්ථාව දෙනවාද නැද්ද යන්න තීරණය කළ යුතු වන්නේ ජනතාවය. නැතිනම් ධම්මික ජනපති කර නාමල් අගමැති කරනවාද යන්න තීන්දු කරන්නේ ජනතාවය. අන්න ඒ ජනතාව බුද්ධිය පාවිච්චි කර අධ්‍යයනය කළ යුතුම ලියවිල්ලක් මේ වන විට සමාජ මාධ්‍ය ඇතුළු වෙබ් අඩවි හරහා සංසරණය වෙමින් ඇත. එහි ඇත්තේ පොහොට්ටුවේ රාජපක්ෂ කඳවුරේ ජනාධිපති අපේක්ෂකත්වය ගැනීමට නම් සම්පූර්ණ කළ යුතු කොන්දේසි 10 ය.

ඒ කොන්දේසි 10 මෙහෙමය.

1. ජනාධිපතිවරණයේදී 51%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගැනීම සඳහා අනෙකුත් දේශපාලන පක්ෂ, කණ්ඩායම්, සිවිල් සංවිධාන සමඟ සන්ධානගත වීමේ වැඩපිළිවෙල ඉදිරිපත් කළ යුතුය.

2. ලෝකයේ අනෙකුත් රටවල් සමඟ තරග කළ හැකි ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපනයක් රටේ සිසු පරපුරට ලබාදීමට අදාළ වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. එමෙන්ම ලෝකයේ ඕනෑම රටක රැකියාවක නිරත විය හැකි පරිදි මෙරට වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන ක්ෂේත්‍රය ජාත්‍යන්තර මට්ටමට ඔසවා තැබිය යුතුය.

3. ගොවි ජනතාව සඳහා ලබාදෙන පොහොර සහනාධාරය වැඩිකිරීම, නව දෙමුහුන් බීජවර්ග හඳුන්වාදීම තුළින් අස්වනු වැඩිකිරීම, පාංශු පරීක්ෂණ පත්‍රිකාව (දසක ‍ය‍ැකළුය ක්‍රි) පදනම් කරගත් පොහොර නිර්දේශ ක්‍රමයක් හඳුන්වාදීම යනාදිය ඔස්සේ කෘෂිකර්මාන්තය සංවර්ධනය කරමින් ස්මාර්ට් කෘෂිකර්මාන්තයක් බිහිකිරීමේ වැඩපිළිවෙල ඉදිරිපත් කළ යුතුය.

4. ග්‍රාමීය ප්‍රදේශවල සහ නාගරික ප්‍රදේශවල දිළිඳුකම තුරන්කිරීම සඳහාත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දියුණු කිරීම සඳහාත් එම ප්‍රදේශවලට මුදල් ගලා එන වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. ඒ අනුව ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශවල ජනතාවට රැකියා දස ලක්ෂයක් බිහිකරන වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. ඉහත වැඩපිළිවෙලවලින් සෑම පුද්ගලයකුටම නිශ්චිත ආදායම් මාර්ග යක් ලබා ගැනීමට හැකි බව සහතික කිරීම.

5. ආර්ථික වර්ධන වේගය 7% දක්වා වැඩි කළ යුතු අතර ආර්ථිකය ප්‍රසාරණය කළ යුතුය. ඒ සඳහා දේශීය සහ විදේශීය ආයෝජන ආකර්ෂණය කරගනිමින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමේ වැඩපිළිවෙල සකස් කළ යුතුය.

6. බඩු මිල සහ ජීවන වියදම ජනතාවට දරාගත හැකි මට්ටමක් දක්වා අඩු කළ යුතුය. දැනට ජනතාව මත දැඩි පීඩනයක් ඇතිවන පරිදි පනවා ඇති ස්ඹ බද්ද අඩු කළ යුතුය.

7. රජය සතු ව්‍යාපාර හෝ රාජ්‍ය දේපළ පෞද්ගලීකරණය නොකළ යුතුය. එමෙන්ම දැනට පාඩු ලබන රාජ්‍ය ව්‍යාපාර ලාභ ලබන තත්වයට පත්කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. සියලුම මහජන සේවාවන් සඳහා ඒකාබද්ධ තොරතුරු සන්නිවේදන තාක්ෂණ වේදිකාවක් පිහිටුවිය යුතුය. වංචා සහ දූෂණ සිදු නොවන පරිදි රජයේ සියලුම මිලදී ගැනීම් සහ ටෙන්ඩර් පටිපාටි සඳහා ලෝකයේ වෙනත් රටවල මෙන් විනිවිදභාවයෙන් යුතු මහජනයාට තොරතුරු දැකගත හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතුය. වංචා සහ දූෂණ පිටුදැකීම සඳහා දැඩි ක්‍රියාමාර්ග
අනුගමනය කළ යුතුය.

8. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල 17ම අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීමේදී පළමු 1000 අතරට ගෙන ඒම සඳහා එම විශ්වවිද්‍යාල සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙලක් ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම රැකියා විරහිත උපාධිධාරීන් නැවත බිහි නොවීම සඳහා එම විශ්වවිද්‍යාලවල පාඨමාලාවන් ජාත්‍යන්තර රැකියා වෙළඳපොලට ගැලපෙන පරිදි සකස් කළ යුතුය.

9. සංචාරක කර්මාන්තය නඟා සිටුවීම සඳහා ශ්‍රී ලංකාවට වසරකට සංචාරකයින් ලක්ෂ 50ක් ගෙන්වා ගැනීමේ ඉලක්කය සහිතව ඊට අදාළ සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.

10. ශ්‍රී ලංකාවට යළි විදේශ විනිමය අර්බුදයකට මුහුණ දීමට සිදු නොවන පරිදි ඩොලර් ඉපයීමේ උපායමාර්ග සහිත නිශ්චිත නව වැඩපිළිවෙලක් ඉදිරිපත් කළ යුතුය.

පොහොට්ටුවේ (රාජපක්ෂ පාර්ශ්වයේ) ජනාධිපතිවරණ අපේක්ෂත්වය හිමිවන්නේ මෙම සියලුම කොන්දේසි සම්පූර්ණ කළ හැකි අපේක්ෂකයකුට පමණක්ය. අමුතුවෙන් හිතන්න දෙයක් නැත. බදු බර අඩු කරන්න කියමින් පසුගියදා
හිටපු ජනාධිපති, පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද නිකුත් කළ නිවේදනයේ සහ මේ කොන්දේසි 10හි අඩංගුවේ කිසිම වෙනසක් නැත. එහි ඇත්තේ මේ රට බංකොලොත් කිරීම කඩිනම් කළ වැරදි ආර්ථික ප්‍රතිපත්තිවලම දිගුවක්ය. වාමාංශික ජාතිකවාදී ආර්ථික වැඩපිළිවෙළමය. මේ රට පසු නූතන විශාලා මහනුවරක්වීම වළක්වාගත්, ජනාධිපති රනිල්ගේ වැඩපිළිවෙළ දිවෙන් ඇද කණපිට ගැසීමක්ය. මිහිමත අමු සොහොනක් වෙන්න ගිය, මිලියන 22ක ජනතාවක් සොම්බීන් බවට පත්වීමෙන් වළක්වා ගනු ලැබූ ජනපති රනිල්ගේ වැඩපිළිවෙළ ආපසු හැරවීමක්ය.

එසේ නම් මේ කොන්දේසිවලට ධම්මික එකඟව රාජපක්ෂ පවුලේ ජනාධිපති අපේක්ෂකයා වනවා නම් ඔහුට කළ හැකි එකම දේ මේ රට ආයෙත් 2022 පැවතියාටත් වඩා නරක තැනකට ගෙනයාමය. ධම්මිකට මේ රට හදන්න අවංක චේතනාවක් ඇත්නම් කොහෙත්ම මේ කොන්දේසි සපුරාළිය නොහැකිය. ඒ ගැන වැඩිදුර නිරීක්ෂණ අවශ්‍ය නොවන්නේ එම කොන්දේසිය සපුරා ගෙන 6,7 කොන්දේසි සපිරූ සැනින්, රට කණපිට ගහන නිසාය. එසේම මේ තුළ රට මුහුණ දී සිටින ආර්ථික අර්බුදයෙන් ගොඩග ැනීම වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැන හෝ ප්‍රායෝගික ඵලදායි කොන්දේසි කිසිවක් නැත. අවම වශයෙන් බදු සංශෝධනය සිදු කළ පසුව ඒ අහිමි වන රාජ්‍ය ආදායම ක්ෂණිකව ලබා ගන්නේ කෙසේද යන්න හෝ සඳහන් නැත. ණය ප්‍රතිව්‍යුහගතකරණය ගැන මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වන වැඩසටහනට සිදුවන දේ ගැන සඳහනක් නැත. ජනතාව පීඩනයෙන් මුදවා ගැනීමට මුදල් සපයා ගන්නේ ධම්මිකගේ සියලු වත්කම් රාජ්‍ය භාණ්ඩාගාරයට ලබාදීද යන්න ගැනවත් සඳහන් නැත. ජනතාව සවිබලගැන්වීම ගැන කතා කරන්නේම නැත. සැබවින්ම මෙහි ඇත්තේ සමාජය තුළ වන වාම ජාතිකවාදීන්ගේ ජනප්‍රිය සටන් පාඨ හොරාගෙන දැමුණු කොන්දේසි 10ක් මිස, ඊට වැඩි දෙයක් නොවේය. එබැවින් මෙය උදේ නැගිට ගහන කෙළ පහරක තරම්වත් වැදගැම්මක් නැත.

ඒ කියන්නේ මෙම කොන්දේසි පිළිගෙන රාජපක්ෂ පවුලේ ජනාධිපති අපේක්ෂකත්වය ලබාගැනීමම පවා මාරාන්තික විහිළුවක්ය. මෙහි ඇති එකම ධනාත්මක කාරණය වන්නේ, මේ වන විටත් පොහොට්ටු පක්ෂයේ සිට ජනාධිපති රනිල්ගේ රට ගොඩනගන වැඩපිළිවෙළට සහය දෙන පිරිසට දෙකෙන් එකක් තෝරාග න්න වෙන තාප්පයට හේත්තු කරදැමීම පමණය. 2019 දී ක්‍රියාත්මක කර, ලංකා ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදය ඇති කරන තරමට අසාර්ථක වූ වැඩපිළිවෙලක් ජයග්‍රහණය කරවීමට ඒ පිරිස ආයෙත් මැදිහත්වනු ඇතැයි හිතන්නවත් නොහැක. එවැනි සාපලත් ප්‍රයත්නයකට අතගසා ලැබූ අත්දැකීම් ආයෙත් විඳගන්නට එම පක්ෂයේ සිහි බුද්ධියක් ඇති කිසිවෙක් කැමති නොවන බවත් පැහැදිළිය.

කොහොමටත් මේ වන විට ජනාධිපති රනිල් සමඟ රට ගොඩදාන මල්වට්ටියට අතගසා සිටින කවුරුත් ප්‍රසිද්ධියේ කියමින් සිටින්නේ, ජනාධිපති අපේක්ෂකත්වයට රනිල් ඉදිරිපත් වනවා නම් තමන් ඊට සහය දක්වන බවය. මෙයින් පෙනෙන්නේ රාජපක්ෂවරුන්ගේ පවුලේ හීනයට රටත් පක්ෂයත් යට කරන්න එහි බහුතරය සූදානමක් නොමැති බවය. පාරේ යන්නත් බැරුව එක පාරට මේ මාරක ළිඳේ රේස් පදින්න යන වැඩ නිසා පොහොට්ටු පක්ෂය ආයෙත් වටයකින් කැබලිවීම කොහෙත්ම නවත්වන්න නොහැකි වන බවය.

මේ අනුව රනිල් මිස වෙනත් අපේක්ෂකයකුට රට ගොඩගැනීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙලක් හෝ හැකියාවක් නැති බවත් පැහැදිලි විය යුතුය. එසේම රනිල්ගේ වැඩපිළිවෙළට විකල්පයක් ඉදිරිපත් කිරීමට තබා ඒ ගැන හිතන්නවත් නොහැකි තරම් හිඟන තැනකට විපක්ෂය පත්ව ඇති බවය.

මේ ගැන සිත්ගන්නා සුළුම ආදර්ශය බවට පත්ව සිටින්නේ තවත් වෙන්ඩ ජනපති අපේක්ෂකයකුව සිටින සජබ නායක සජිත්ය. දිනෙන් දින වැටුණු රට ගොඩනගමින්, රටේ ආර්ථික ස්ථාවරත්වයක් ඇති කිරීමට වෙනත් විකල්පයක් නොමැති බව ජනපති රනිල් තහවුරු කරන වාරයක් වාරයක් පාසා සජිත් කරන්නේ, රනිල්ගේ වැඩපිළිවෙළට සමානව තිබූ සජබ වැඩපිළිවෙළ සංශෝධනය කිරීමය. ඒ වෙනුවෙන් වන ගමනේ සජිත් තවත් මාරාන්තික පියවරක් පෙරට තැබුවේ ඩලස්ගේ නිදහස සභාවේ සැඟව සිටි ගෝඨාගේ ආර්ථික උපදේශක වූ නාලක ගොඩහේවා තමන්ගේ ආර්ථික උපදේශක කර ගනිමින්ය. එසේම හර්ෂ, කබීර් සහ එරාන් ඇතුළු සජබ ආර්ථික කමිටුව ඉදිරිපත් කළ **"බ්ලූ ප්‍රින්ට් ඊකොනමි එක"**ට පයින් ගසමින්ය.

මේ ගැන වන ලස්සන කතාවක් ගියේ පසුගිය දිනක සජබ ජ්‍යෙෂ්ඨයන් පිරිසක් සමඟ සජිත් පැවැත්වූ සාකච්ඡාවකදීය. සජබ අභ්‍යන්තර දේශපාලන ආරංචි මාර්ග සඳහන් කරන ආකාරයට එහිදී ඉම්ටියාස් අසා ඇත්තේ සජබ හදන සන්ධානයට එක්වන පිරිස, සජබ ආර්ථික දර්ශනය වූ **"බ්ලූ ප්‍රින්ට් ඊකොනමි එක"** පිළිගන්න ඕන නේද කියාය. ඊට සජිත් ප්‍රතිචාර දක්වා ඇත්තේ "අපේ 'බ්ලූ ප්‍රින්ට් ඉකොනමි' එකේ තියන ඒවා රනිල් කරගෙන යනවනේ. දැන් ඒකේ අපිට කරන්න කියලා දෙයක් ඉතුරුවෙලා නෑනේ" කියාය. ඒ අවස්ථාවේ හර්ෂ කියා ඇත්තේ, "නෑ... නෑ... දැන් අපි දැම්මේ දෙවෙනි ප්‍රින්ට් එකනේ. තුන්වෙනි එක දැන් රෙඩී. ළඟදීම එළියට දාන්න පුළුවන්. අපි රට වටේ සම්මන්ත්‍රණ තියලා, ඒ ගැන සංවාදයක් ඇතිකරන්නයි යන්නේ" කියාය. එහෙත් ඒ ගැන කිසිවක් ආයෙත් කතා කරන්න සජිත් ඉදිරිපත්ව නැත. ඒ කියන්නේ සජබ ආර්ථික වැඩපිළිවෙළ ගොඩහේවාකරණය වී ඇති බවය. 2022 තැනට රටේ ආර්ථිකය ගෙනෙන්න න්‍යාය සැපයූවන් ආයෙත් වටයකින් කරළියට පැමිණ ඇති බවය. ඒ කියන්නේ මහාම සාපයකට සජිත් වැරදීමකින් හෝ ජනාධිපති වුණොත්, ක්‍රියාවට නැගෙන්නේ පොහොට්ටුව වෙනුවෙන් රාජපක්ෂ පවුල ඉදිරිපත් කර ඇති කොන්දේසි 10 වැන්නක්ම ක්‍රියාත්මක වීමය.

විපක්ෂයේ මේ හිඟන ප්‍රතිපත්තියෙන් ගැලවෙන්න ජවිපෙ - ජාජබ නායක අනුරටද නොහැකිවී ඇත. ජවිපෙ රතු පැහැය රෝස පැහැයට හරවා හැදූ ජාජබ ද මේ වන විට සිය සුපුරුදු වාම ජාතිකවාදී ආර්ථික මොඩලය වෙත සීරුමාරු වෙන්න ගෙන ඇත. ජාජබ ආරම්භයේ සිය පැරණි ජවිපෙ ආර්ථික ප්‍රතිපත්තියෙන් කැඩී වෙන්වෙන ස්වභාවයක් පෙන්නුවත්, එය නැවත විජේවීරකරණය වෙමින් ඇත. ඊට කදිම නිදර්ශනය පසුගියදා එළියට පැන්නේ ජාජබ ආර්ථික විශේෂඥ සුනිල් හඳුන්නෙත්ති වෙතින්ය. ප්‍රසිද්ධ නාලිකාවක් සමඟ පැවැත්වූ එම සම්මුඛ සාකච්ඡාවේදී හඳුන් කිව්වේ, ස්වෛරී බැඳුම්කර සඳහා ව්‍යාපාරිකයින් මුදල් යොදවන්නේ එහි අවධානම භාරගෙන බවය.

එම නිසා ස්වෛරී බැඳුම්කර ණය ගෙවන්නේ නෑ යැයි අපි කිවහොත් ණය හිමියන් "හා කමක් නෑ මචං කියනවා" යැයි ද හඳුන් කිව්වේය.

තමන් ගත් ණය ගෙවන්නේ නම් ඒ සඳහා කාලයක් උවමනා බවත් කොන්දේසි පැනවීමට එකඟ නැති බවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කියන බවත් එහිදී හඳුන් කිව්වේය. හඳුන් පමණක් නොව වෙන්ඩ ජනාධිපතිට ඇඳ සිටින අනුර ද පසුගිය දිනක ප්‍රසිද්ධ සභාවක මෙසේ පැවසීය.

"පෞද්ගලීකරණයෙන් ඇති වැඩේ මොකක්ද?පාඩු ලබනවා කියා රාජ්‍ය ආයතන විකිණීමට අපි විරුද්ධයි" වැනි කතා ගානක් අනුර කියන විට අනුර සමඟ බිස්නස් ෆෝරම් තිබු ව්‍යාපාරිකයන්ට මොනවා හිතුනාදැයි අපි දන්නේ නැත. එසේම අධ්‍යාපනය, සෞඛ්‍ය වැට් බද්දෙන් නිදහස් කර තිබියදී ඒවාට වැට් ගසා ඇති බවට අනුර බොරු කියන්නේ, වේදිකාව ඉදිරිපිට ඉන්නේ ජනතාව වෙනුවට "පොල්ලෙල්ලක් දැම්මත් දැන් අපිට ඡන්දය දෙනවා" කියා අසාගත් මෝඩ මෝල්ලු බවට පැහැදිළි තක්සේරුවක් ඇතිව විය යුතුය.

ඒ තක්සේරු කෙසේ උවත් ජනපති රනිල්ට අභියෝග කරන්න දැනටමත් ඉදිරිපත්ව සිටින වෙන්ඩ ජනාධිපතිලා තිදෙනාගේම වචන වෙනස් වුවත් සන්ධාරය පොදු බව හඳුනා ගැනීම දුෂ්කර නැත. ඒ කියන්නේ රට බංකොලොත් කළ ආර්ථික මොඩලයෙන් පිට අදහසක් ඔවුන්ට නොමැති බවය. මේ හමුවේ මිලියන 22 ජනතාව ඇසිය යුත්තේ, ධම්මික, සජිත්, අනුර එන්නේ ආයෙත් ගෝඨාභය ගිය පාරේ යන්න නම්, එක්කෙනෙක් කළ කෙළවිල්ලට මේ පාර තුන්දෙනෙක් මොකටද කියාය?

කල්ප අනුත්තර ලියනගේ

# දැන් බනින අය අනාගතයේ මට හොඳ කියයි



## Mr. President

නිවාඩුවක් සඳහා කොළඹින් පිටව සිටි ජනපති රනිල් වික්‍රමසිංහ නැවත කොළඹ පැමිණියේ 31 දා දහවල්ය. කොළඹ පැමිණි රනිල් යළිත් යකා බැඳ ගත්තා සේ රාජකාරිවල නිරත වූවේ පුරුදු පරිදිය. එදින ඔහු රාජකාරී අවසන් කරනවිට නව වසරත් උදාවී තිබිණි. එදින සවස් වරුවේ ජනපති රනිල් එක්සත් ජාතික පක්ෂ නිලධාරී මඩුල්ල කැඳවා තිබුණේ පක්ෂ කටයුතු ගැන කතා කරන්නටය.

අලුත් ව්‍යවස්ථාව අනුව තනතුරු පත්කිරීම ගැන කතා කරන මේ හමුවට එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන, මහලේකම් රංගේ බණ්ඩාර, සභාපති වජිර අබේවර්ධන, ජාතික සංවිධාක සාගල රත්නායක හා උප නායක අකිල ද එක්ව සිටියහ. මේ අතරවාරයේදී ඇමති හරීන් හා මනූෂ ද වෙනත් රාජකාරී කටයුත්තකට පැමිණි අතර ඔවුන් ද සාකච්ඡාවට වාඩි වූවේ අවසන් භාගයේදී ය.

ඉකුත් ඔක්තෝබරයේ පක්ෂ විශේෂ මහා සම්මේලනයේදී සම්මත කරගත් නව ව්‍යවස්ථාව ප්‍රකාරව නායකත්ව මණ්ඩලය, කෘත්‍යාධිකාරි මණ්ඩලය හා පක්ෂ ක්‍රියාකාරී කමිටුවලට නියෝජිතයන් පත්කිරීම ගැන ද සාකච්ඡා කළෝය. නව වසරේ ඉදිරි සංවිධාන කටයුතු ගැන කතා කළ පිරිස මධ්‍යම රාත්‍රියේ පිටව ගියේ නව වසරට එකිනෙකාට සුබ පතා ගනිමිනි.

### ජනප්‍රිය තීන්දු ගන්න අමාරුයි

පසුවදා පෙරවරුවේ නව වසරට රාජකාරී ආරම්භ කිරීමේ කටයුතු සංවිධානය වූවේ ජනාධිපති ලේකම් සමන් ඒකනායක ගේ උපදේශයනි. ජනපති පැමිණ ජාතික ධජය එසැවීමෙන් පසු නව වසරේ රාජකාරි ප්‍රතිඥාව ලේකම් කාර්යාලයේ සේවක මණ්ඩලය ලබා දුන්හ.

ජනපති රනිල් මුණ ගැසී සුබ පැතීමට මැති ඇමතිවරු රැසක් පැමිණ සිටි අතර බන්දුල ගුණවර්ධන, ශෙහාන් සේමසිංහ, රංජිත් සියඹලාපිටිය, වජිර අබේවර්ධන එහි පෙරමුණේ වූහ. ජනපති රනිල් තේ පැන් සංග්‍රහය පැවැති ස්ථානය වෙත පැමිණියේ මේ අතරවාරයේය. ජනාධිපති ලේකම් කාර්යාලයේ සියළු ප්‍රධාන නිලතල දරන්නන් එහි පැමිණ සිටිය ද කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක එහි නොමැතිවීම ගැන කසු කුසුවක් පැවතියේය.

ජනපති අසලට පැමිණි ඇමති බන්දුල, වෘත්තීය සමිති අධ්‍යක්ෂ ජනරාල් සමන් රත්නප්‍රිය හා මහාචාර්ය ආශු, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දිනිත් චින්තක රටේ තත්ත්වය ගැන කතා කරන්නට වූහ. වැට් බදු ක්‍රියාත්මක වීමත් සමඟ ඉන්ධන ඇතුළු භාණ්ඩයන් හි මිල ඉහළ යෑම එහි ප්‍රධාන මාතෘකාවක් වූවේය.

"මේ වෙලාවේ ජනප්‍රිය තීන්දු ගන්න මට අමාරුයි. මම ගන්නේ රටේ ජනතාවගේ අනාගතය වෙනුවෙන් තීන්දුයි. දැන් බැන්නත් ජනතාව අනාගතයේදි මට හොඳ කියාවී." ජනපති කීවේ නළල රැළි ගන්වමිනි.

### බොරු සුරංගනා කතා එපා

"බජට් සෙමිනා ටික මම කරගෙන යනවා. බදු ගැනත් එතනදි කතා කරලා ජනතාව දැනුම්වත් කරනවා." සමන් රත්නප්‍රිය කතාව ආරම්භ කළේය.

"ඔව් බොරු සුරංගනා කතා කියන්නේ නැතුව ඇත්ත කතාව කියන්න ඕනේ. මේ මාර්ගය හැර වෙනත් මාර්ගයක් නෑ. මේ ගමන කටුක හින්දා තමයි හැමෝම එදා මේ වගකීම ගන්නේ නැතුව පැනලා ගියේ." ගුවන් හමුදා මූලස්ථානය විවෘත කරන තැනදී ආර්ථික තත්ත්වය ගැන මම කියනවා." කියූ ජනපති මුදල් අමාත්‍යාංශ ලේකම් කැඳවා තොරතුරු විමසන්නට වූවේය.

මුදල් ලේකම් කියූ සංඛ්‍යා ලේඛන කොළයක් රැගෙන ඔහුම සටහන් කරගත්තේ ඊළග කතාවේදි ඒ සඳහන් කිරීමටය. ඒ අවසරයෙන් ඇමති බන්දුල කීවේ "සර් කියපු විදියටම මම අනුරාධපුර ජයශ්‍රී මහ බෝධීන් වහන්සේ අභියස දී රටට සෙත් පතා සර්ව රාත්‍රික පිරිත් දේශණාවක් පැවැත්වූවා" කියාය.

ජනපති හිස සලද්දී බන්දුල නැවත කීවේ පිරිත් දේශනාව ජාතික රූපවාහිනියෙන් හා ස්වාධීන රූපවාහිනියෙන් සජීවීව පෙන්වූ බවකි.

"ඒ පිරිත් අහන්න ඇමතිතුමා දුම්රිය සාමාන්‍යාධිකාරි තුමාත්, මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරී කණ්ඩායමත් කොළඹ ඉඳලා අනුරාධපුරයට දුම්රියෙන්ම එක්කගෙන ගියා." මහාචාර්ය ආශු කීවේ සාකච්ඡාව සැහැල්ලු කරවමිනි.

### සාගල සිරිකොතට

පිරිස අතරට කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල ආවේ ජනපති ඉන් පිටවීමට සූදානම් වෙද්දීය. "ආ සාගල මැතිතුමා කොහෙද ගිහින් හිටියේ. අපි බැලුවා මොකද නැත්තේ කියලා. අපි හිතුවේ වෙන ප්‍රශ්නයක් ද දන්නේ නෑ කියලායි." එහි සිටි අය නව වසරට සුබ පතන ගමන් ඔහුගෙන් එම ප්‍රශ්නය ඇසීමට ද අමතක නොකළේය.

තමන් උදෙන්ම එක්සත් ජාතික පක්ෂ මූලස්ථානයට ගොස් එහි රාජකාරී ආරම්භ කිරීමේ අවස්ථාවට එක්වූ බව සාගල කීවේ කාගේත් සැක දුරු කරමිනි. පක්ෂ මහලේකම් රංගේ ඇතුළු පිරිස සිරිකොත පක්ෂ මූලස්ථානය නව වසරට සැරසුවේ ඉදිරි මැතිවරණයට පෙර සූදානමක් ලෙසිනි. සිරිකොතට නන් දෙසින් පිරිස පැමිණියේ පක්ෂ නායකයන්ට නව වසරට ආශිර්වාද කිරීමටය

නව වසරට කිරි උතුරුවා අලුත් අවුරුදු කෑම මේසය වෙත ගිය සාගල රත්නායක කෑම මේසය ඉදුල් කරන්නටත් පෙර නොඉඳුලේම පැමිණ සිටියවුන්ට කියා සිටියේ මේ වසර සඳහා මහලේකම් ලෙස රංගේ බණ්ඩාර ජනාධිපතිතුමන් විසින් යළිත් පත් කර ඇති බවය.

ඉතිරි තනතුරු පසුව පත් කරනු ඇති බවද ඔහු කීවේ පැමිණ සිටි පාක්ෂිකයන් දිරි ගන්වමිනි. එම අවස්ථාවට එක්සත් ජාතික පක්ෂයේ සිට සජබයට ගිය බදුල්ල දිස්ත්‍රික් හිටපු මන්ත්‍රී සමරවීර වීරවන්නි ද පැමිණ සිටියේය.

මහලේකම් රංගේ නව වසරට වැඩ ආරම්භ කළේ සිරිකොතේ දැනට සිටින පැරණිම සාමාජිකයා වන ධනපාල මාමා වෙත බුදු පිළිමයක් පිරිනමමිනි. එසේම මැලේසියාවේ සිට ගෙනා පිරිත් නූල් ඔහුට දුන්නේ සිරිකොත කාර්ය මණ්ඩලයට දෙන ලෙස කියමිනි. මහලේකම්ගේ කාර්යාලය වෙත ගිය සැමට ඔහු මෙම පිරිත් නූල් හා පිළිම ලබා දුන්නේ නව වසරට ආසිරි පතමිනි.

### ජනපති එකදිගට වැඩ

ජනපති රනිල් අකුරෙගොඩ නව ගුවන් හමුදා මූලස්ථානය විවෘත කිරීමට ගියේ ජනාධිපති ලේකම් කාර්යාලය වෙත පැමිණි සැමට සුබ පැතුම් එක් කළාට පසුවය. එහිදි රටේ ආර්ථිකය ගැන කතා කළ ජනපති රනිල් නැවත ලේකම් කාර්යාලය වෙත පැමිණියේ සවස පැවැත්වෙන නව වසරේ පළමු කැබිනට් හමුවට එක්වීමටය. ඉන් අනතුරුව ක්‍රිකට් ගැන සොයා බැලීමට පත් කළ කැබිනට් අනුකමිටුවේ වාර්තාව ජනපති වෙත පිළිග ැන්වූවේය.

අඟහරුවාදා පෙරවරුවේ ජනපති ආරක්ෂක මූලස්ථානය වෙත ගියේ ආරක්ෂක ප්‍රධානීන් මුණ ගැසීමටය. එහිදි රටේ වත්මන් ආරක්ෂක තත්ත්වය ගැන කතා බහ කෙරුනි. පසු ඔහු සිය කාර්යාලය වෙත පැමිණියේ මෙරටට පැමිණ සිටින පකිස්ථාන ආරක්ෂක ලේකම් මුණ ගැසීමටය. එම අවස්ථාවට ජාතික ආරක්ෂක උපදේශක සාගල රත්නායක ද එක්ව සිටියහ. ආරක්ෂක රාජ්‍ය ඇමති ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් සහ ආරක්ෂක ලේකම් ද ඒ අතර වූහ.

එදින දහවල් ජනපති රනිල් ශිල්පාභිමානි හස්ත කර්මාන්ත ජනාධිපති සම්මාන ප්‍රදානයට එක්වූවේය. එය නිමවා කාර්යාලය වෙත එද්දී ඩෙංගු මර්දන කාර්ය සාධක බලකාය සාගල රත්නායකගේ ප්‍රධානත්වයෙන් රැස්ව තිබූ අතර ජනපති රනිල් ද ඊට එක්ව උපදෙස් දුන්නේ ඩෙංගු මර්දනය කරන ප්‍රදේශවල යළි ඩෙංගු උවදුර ඇති නොවීමට කටයුතු සැලසුම් කරන ලෙසටය.

### එජාපයේ නව වෙනස

එදින සවස එක්සත් ජාතික පක්ෂ කළමනාකරණ කමිටු රැස්වීම ජනපති ප්‍රධානත්වයෙන් පැවැති අතර ඊට ජනපති ද එක්වූවේය. පක්ෂ ඉදිරි සැලසුම් හා කාර්යයන් ගැන විමසූ ජනපති රනිල් සිය විදේශ සංචාරය අවසන් කර පැමිණි පසු පක්ෂ නව නිලධාරි මණ්ඩලය පත් කරන බව දැනුම් දුන්නේය. එහිදි මහලේකම් රංගේ කියා සිටියේ දිස්ත්‍රික් රැස්වීම්, ආසන වගකිම් පැවරීම හා සෑම කොට්ඨාශයකටම නව කථිකයන් පත්කර ඔවුනට හඳුනාගැනීමේ සහතිකයක් ලබා දෙන බවයි. එය ලබන 21 දා සිරිකොත දී පැවැත්වෙන අතර 500 ක් දෙනෙකුට මෙම සහතික පිරිනැමීමට නියමිතය.

බදාදා දවස පුරාම ජනපති රනිල් රැ ස්වීම් ගණනාවකට එක්ව සිටි අතර ආර්ථික කටයුතු පිළිබඳ කැබිනට් අනුකමිටුවට ද සහභාගී වූවේය. මෙහිදි කෘෂිකර්ම ක්ෂේත්‍රය නවීකරණය කොට ඌණ උපයෝගිත ඉඩම් සම්පත මේ වෙනුවෙන් යොදා ගන්නා ආකාරය ගැන සොයා බලා කටයුතු කිරීමේ වැඩසටහනක් ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පවත්වාගෙන යාමට මෙහිදි තීන්දු කෙරුනි. එහි ව්‍යාපෘති කාර්යාලයක් ආරම්භ කළ අතර ඇමති බන්දුල ද මෙයට දායකත්වය සපයනු ලබයි.

### සජබයේ කචල්

එදින සවස අනුර ප්‍රියදර්ශන යාපා, නිමල් ලන්සා, පියංකර ජයරත්න ඇතුළු කණ්ඩායමක් ජනපති හමුවට පැමිණියේ ඔවුන්ගේ නව දේශපාලන කාර්යාලය ගැන දැනුම්වත් කිරීමටය. ජනාධිපතිතුමන්ගේ වැඩපිළිවෙල සහාය දෙන අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා එක්වෙමින් කටයුතු කරන බවද ඔවුන් මෙහිදි කියා සිටියේය. ඒ අතර ශාන් විජයලාල් හා දයාශ්‍රිත තිසේරා සජබයට පැමිණීම ගැන ද කතා බහක් ඇතිවිය. මහින්දානන්ද හා ප්‍රසන්න රණතුංග ද ඒ අතරතුරේ ජනපති මුණ ගැසීමට පැමිණියහ.

"සජිත් කැම්පේන් එක ජනවාරි 01 දාම පටන් ගත්තේ ශාන් වියලාල් ද සිල්වාව අරගෙන. මේකට අපේ ගොඩක් අය කලබල වෙලා." නිමල් ලන්සා කීවේය.

"ශාන් විජයලාල්ට ආණ්ඩුව පැත්තේ ඉඩක් තිබුණේ නෑ. අනෙක් පැත්තෙන් ශ්‍රීලනිපය එක්කත් ප්‍රශ්නයක් දා ගෙන හිටියේ. කොහොම වුණත් ආණ්ඩුවෙන් ගාල්ලට රමේෂ් පතිරණ, වජිර අබේවර්ධන, මනූෂ, මොහොන් ද සිල්වා වගේ ප්‍රබල චරිත ඉන්න නිසා එයාට එන්න විදියක් නෑ." ඇමති ප්‍රසන්න කීවේය.

"අනෙක අම්බලන්ගොඩ වැඩිම මනාප ගත්තේ එහේ ප්‍රාදේශීය සභා සභාපති. එයා ඉන්නේ අපිත් එක්ක. මෙයාට යන්න තිබුණ තැන ස.ජ.බ ය. මේක කලින්ම ආණ්ඩුව දැනගෙන හිටියා." ඇමති ශෙහාන් ද කතාවට එක්වූවේ එලෙසිනි.

"ඡන්දයක් පේන මානයක නැතුව මෙහෙම කට්ටිය අරගෙන ඒක පවත්වාගෙන යන්න පුළුවන්ද? එයා හැමදාම කළේ මේ වගේ වැඩනේ" ඇමති මනූෂ කීවේ සිනහසෙමිනි.

"මෛත්‍රිපාල සිරිසේන ගේ කැම්පේන් එක අපි පටන් ගත්තේ සති තුනෙන්." වජිර ද කතාවට එකත්වූවේ පැරණි මතක සිහිපත් කරමිනි.

"අනෙක ජී.එල්.ලා නාලක ගොඩහේවලා ගත්ත එකෙන් සජබ ඇතුලේ ප්‍රශ්න වැඩි වෙලා. නාලක ගොඩහේවා තමයි ගෝඨගේ ප්‍රතිපත්ති සම්පාදක. වැට් බද්ද 8% කට ගෙනල්ලා ආර්ථිකය කඩා වට්ටන්න උදව් වෙච්ච කෙනෙක් එක්ක සජිත්ට ඉන්න පුළුවන් වුණාට අනෙක් අයට බෑ." මහාචාර්ය ආශු කීවේ ස්ථිර හඩිනි.

"දයාශ්‍රිතව ගෙනාවේ නිරෝෂන් පෙරේරා පහළට දාන්න කියලා තමයි ආරංචි" මන්ත්‍රී මධූර කීවේ සිනාසෙමිනි.

### ජනපතිගේ ආත්ම ශක්තිය

සියලු කතා අසා සිටි ජනපති රනිල් "ඔයාලා කලබල නොවී ආසනවලට ගිහින් තම තමන්ගේ ආසනවල වැඩ කරන්න. කලබල වෙලා හදිසි වෙලා කැම්පේන් කරන්න බෑ. ජනාධිපතිවරණ කැම්පේන් එකට වඩා මට තියෙන්නේ රටයි ආර්ථිකයයි ගොඩදාන කැම්පේන් එක." ජනපති රනිල් කීවේ සිනාසෙමිනි.

සාකච්ඡාව නිමවා පිටතට යන අතරතුර පිරිස කතාවූවේ "ජනාධිපතිතුමා ලොකු ආත්ම ශක්තියකින් සිටින බව පේනවා. මේක අපට ලොකු විශ්වාසයක් ඇති කිරීමට හේතුවක් වුනා." යනුවෙනි.

### වැඩ කඩාකප්පල් කරන්න දෙන්න බෑ

බ්‍රහස්පතින්දා සවස කිළිනොච්චි දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමට යාමට තිබුණද පෙරවරුවේ ඔහු කාර්යාලය වෙත පැමිණියේ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් මුණ ගැසීමටය. ඊට පෙර මැති ඇමතිවරු පිරිසක් මුණ ගැසුණු ජනපති රනිල් රටේ තත්ත්වය ගැන ද කතා කළේය.

"විදුලියේ සහ ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ කණ්ඩායමක්, රට දැන් යන ගමන කඩා කප්පල්කරන්න කටයුතු කරනවා. මොකද මේ මාස දෙක තුන තමයි සංචාරකයෝ වැඩිපුරම රටට එන්නේ." ඇමති බන්දුල කිවේය.

"ඔව් දැන් අපි දකුණු පළාත කේන්ද්‍ර කරගෙන විශේෂ දේශීය උත්සව රැසක් කරන්න යනවා. සංචාරකයන් ඉලක්ක කරගෙන. ගාලු සාහිත්‍ය උත්සවය තියෙනවා. අනෙක් පැත්තෙන් ලෝක ප්‍රසිද්ධ බටහිර ගායකයෙක් වන ඇන්ඩ්‍රි බොචෙල් ලංකාවට එනවා. ඉන්දියානු නලු නිලියෝ එනවා. මේ වැඩ කඩාකප්පල් කරන්න දෙන්න බෑ." ඇමති මනුෂ කීවේ ස්ථිර හඩිනි.

"විරෝධය පළ කළාට කමක් නෑ, හැබැයි රටේ වැඩ කඩාකප්පල් කරන්න දෙන්න බෑ." කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල ද කතාවට එක්වූවේ එලෙසිනි. "මේවා පිටි පස්සේ විපක්ෂ දේශපාලන බලවේග ඉන්නවා. මොකද ජනාධිපතිතුමා යන වැඩපිළිවෙල ඉදිරියට ගියොත් රට දියුණු වෙන බව මේ අය දන්නවා.." මන්ත්‍රී දොලවත්ත කීවේ බැරෑරුම්වය.

ජනපති සවස කිළිනොච්චි ගිය අතර ඉරිදා දිනය තෙක් ජනපති රනිල් යාපනය අර්ධද්වීපය තුළ සංචාරය කිරීමට නියමිතය.

Mediaman




# VAT නැති වුණා නම් ලැව්වලිනුත් වැඩක් නැත

එරෙහිව නොකරපු දෙයක් නැත. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී බැංකු පද්ධතිය

ල ලංකාවේ දේශපාලන කතන්දර බොහෝ විටම විහිළු සහගතය. වගකීම් විරහිතය. එහෙත් මේවා විශ්වාස කරගෙන දේශපාලන තීන්දුවලට එළැඹුනු බහුතරයක් දෙනා තමන්ගේ තීරණය නිසා රටට සිදුව තිබෙන හානියට වගකියන්නේ නැත. රටක ජනතාවගේ හැටි එහෙමය. ඒ ගැන ජනතාවට දොස් කියා වැඩක් නැත. නමුත් එහෙම ජනතාවක් සමග වැඩ කරමින් නිවැරදි දේ කිරීමේ හැකියාවක් රටක පාලකයන්ට තිබිය යුතුය. වඩා නිවැරදි දේශපාලනය වන්නේ එයය. නමුත් ඊට සුවිශේෂී හැකියාවක් හයියක් තිබිය යුතුය. විශේෂයෙන්ම රටක් බරපතල අර්බුදයකට ගිය විට එය විසඳාගැනීම, බොරුවෙන් රැවටිල්ලෙන්, සංදර්ශනවලින්, විහිළුවෙන් තහලුවෙන් කළ නොහැක. රට ගැන, රටේ ජනතාව ගැන වගකීම් සහගතභාවය රටේ නායකත්වය තුළ තිබිය යුතු අත්‍යාවශ ගුණාංගයය. නමුත් මේ වගකීම් සහගත දේශපාලනය, එහෙම කෙනෙකුට ලෙහෙසියෙන් පිහිටන්නේද නැත.

අද ශ්‍රී ලංකාව ගතකරමින් සිටින්නේ මේ වගකීම් සහගත බව සහ වගකීම් විරහිත දේශපාලනයේ පරතරය අත්දකිමිනි. ඉතිහාසය තුළ මුහුණ දුන් බරපතලම ආර්ථික අර්බුදය හමුවේ එය විසඳීමේ වගකීම භාරගන්න කිසිවකු ඉදිරිපත් නොවුණ මොහොතේ ඒ දෙගිඩියාවකින් තොරව භාරගත්තේ රනිල් වික්‍රමසිංහය. ඔහු අර්බුදය විසඳාග ැනීමට සමත් විය. නමුත් එය මැජික් එකක් නොවේ. සිදුව ඇති දේ, ඊට ඇති විසඳුමත්, එය ක්‍රියාත්මක කෙරෙන ආකාරය ගැනත් එහි ප්‍රතිවිපාක එලදෙන්නෙ කෙසේද යන්න ගැනත් සියල්ල සවිස්තරව සඳහන් කරමින් ඔහු සිය කාර්යභාරය ඉටු කළේය. රටට බොරු කළේ නැත. විහිළු කළේ නැත. සංදර්ශන පෙන්වන්න ගියේ නැත. එසේම වගකිම් විරහිත බාල ජනප්‍රිය දේශපාලනය මත තම පැවැත්ම ස්ථිර කරගෙන සිටින විපක්ෂයේ අනේක විද බාධක මධ්‍යයේ ඔහු මේ අර්බුදය විසඳීමට සමත් වී තිබීමත් සුවිශේෂීය.

අර්බුදය විසඳාලීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට පැතිය යුතු බව රනිල් මුලින්ම කියන විට එවකට ආණ්ඩුවත් විපක්ෂයේ කට්ටියත් කීවේ IMF නොග හින් වැඩේ ගොඩදැම්මිය හැකි බවය. රනිල් IMF සමග සාකච්ඡා පටන්ගන්නා විට කිවේ IMF ගිහින් ගොඩගිය රටක් නැති බවය. ඒ එකඟතාවලට පැමිණි විට කීවේ ඒවා ඉටු කළ නොහැකි බවය. බදු වැඩි කිරීම් සහනාධාර කප්පාදුව ආදිය නිසා ජනතාව දැවැන්ත පිඩාවකට ගොදුරු වන බවත් රාජ්‍ය දේපොළ කුණු කොල්ලයට විකුණා දැමීමට සිදුවෙන බවත් ආදී කතන්දරය. ඒ ආර්ථික ප්‍රතිසංස්කරණ එකින් එක ක්‍රියාත්මක වෙද්දි ඒ සෑම එකකටම විරුද්ධව උද්ඝෝෂණ විරෝධතා වැඩවර්ජන කරමින් එය කඩාකප්පල් කිරීමට සැරසුණේය. බදු ප්‍රතිසංස්කරණයට කඩාවැටෙන බවට දින වකවානුත් සමග කීමට තරම් ඉක්මන් විය. සේවක අර්ථ සාධකය මුළුමනින්ම අහිමි වෙන බවත් කීවේය. ඒ ආදි වශයෙන් කතන්දර බොහොමයක් කියමින් සිටි විපක්ෂයට ඒ කිසිවක් සිදුවෙනවා දකින්නට ලැබුණේ නැත. නමුත් රට මුහුණ දෙමින් තිබුණ පීඩාකාරිත්වය ඉතා වේගයෙන් සමනය වෙනවා නම් දකින්නට ලැබිණි. මේ දිනවල වැට් බදු සංශෝධනය අල්ලාගෙන පොළොවෙ හැපි හැපී වැළලෙන්න පටන් ගෙන තිබෙන විපක්ෂය වැට් එක නිසා මහා විනාසයක් සිදුවෙනවා යැයි කතන්දර මවමින් සිටී. නමුත් මේ කියන කිසිවක් සිදුවීමට නියමිත නැත. යම් පීඩාවක් ගෙන ආවද ඒ තාවකාලිකය.

### රජය මුහුණ දුන් ප්‍රධාන අභියෝග

වැට් බදු අනුපාතය සම්බන්ධයෙන් රාජ්‍යය අනුගමනය කළේ සමාජයට වඩාත්ම අඩු බලපෑමක් සිදුවන ක්‍රියාදාමයකි. රටේ ආර්ථික අර්බුදයට තුඩු දුන් ප්‍රධාන ගැටළුවක් වූ රාජ්‍ය ආදායම වර්ධනය කිරීම වෙනුවෙන් ගත් උපක්‍රමික පියවරක් ක්‍රියාත්මක කරමින් මේ මොහොතේ අත්‍යාවශ්‍ය සහ අනිවාර්ය පිළියමක් යෙදීමක් ලෙස මෙම බදු ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක විය.

ආර්ථික අර්බුද හමුවේ රජය මුහුණ දුන් මූලික අභියෝග හතරකි. එහිදී කඩිනමින් කළ යුතු වූ කෙටිකාලීන ක්‍රියාමාර්ග ලෙස, ආදායම් වැඩි කරගැනීම හා වියදම් පාලනය හරහා 2023 වසර අවසාන වෙද්දී ප්‍රාථමික අයවැය ශේෂ ඉලක්කය ළඟා කරගැනීම. විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළු ඒහා සම්බන්ධ කරුණු මඟින් 2023 වසර අවසන ජංගම ගිණුම් ශේෂ ඉලක්කය ළඟා කරගැනීම විය. දීර්ඝ කාලීනව ආදායම් වැඩි කරගැනීම හා තිරසාර ලෙස ප්‍රාථමික අයවැය ශේෂ ඉලක්කය පවත්වා ගනිමින්, ආර්ථික වර්ධනය හා අත්‍යවශ්‍ය සුබසාධනය පවත්වා ගත හැකි මට්ටමක රාජ්‍ය වියදම් ද පවත්වා ගැනීම සහ අවසන් වශයෙන් අපනයන ආදායම් වැඩි කර ගෙන, ආනයන සීමා නොකරමින්, තිරසාර ලෙස ජංගම ගිණුම් ශේෂ ඉලක්කය පවත්වා ගැනීම එම අභියෝග හතර හැඳින්විය හැකිය.

මේ ඉලක්ක ජය ගැනීම මඟින් ලංකාවේ ආර්ථිකයේ දීර්ඝ කාලීනව පවතින ගැටළු වන අයවැය හිඟය සහ ජංගම ගිණුම් හිඟය යන ප්‍රශ්න දෙකට දිගුකාලීනව විසඳුම් සපයමින් ඒ හරහා දිගුකාලීනව රටේ ආර්ථික ස්ථායීතාවය ඇතිකිරීම බලාපොරොත්තු විය.

අර්බුදයට ආසන්නම හේතුව වූයේ රජයේ ආදායම් අහිමි කරගනිමින් බදු ලිහිල් කිරීමය. එදා වැට් අනුපාතය සියයට 8 දක්වා පහත හෙළමින් සහ වෙනත් ආදායම් බදු සහන දෙමින් රාජ්‍ය ආදායම අඩකින් පමණ අහිමි කරගෙන තිබිණි.

### අභියෝග ජයගැනීම

එම තත්වයන් වලක්වාලීමට පළමුව බදු ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙනු ලැබීය. මෙහිදී වැට් අනුපාතය සියයට 15 දක්වා ඉහළ දමමින් රජය ක්‍රමානුකූලව ආදායම් රැස් කරගැනිම සිදු කර තිබිණි. මෑතක දී ගත් පියවර වූයේ බලපොරොත්තු ලෙස බදු ආදායම නොලැබීම නිසා වැට් අනුපාතය සියයට 18 දක්වා තවත් සියයට 3කින් ඉහළ දැමීම, වැට් අයකර ගැනීමේ වාර්ෂික පිරිවැටුම් සීමාව රුපියල් මිලියන 80 සිට 60 දක්වා පහත හෙළීම සහ වැට්වලට අයත් නොවු තවත් ආයිතමයන් කිහිපයක් ඊට එකතු කිරීමය.

මෙමගින් භාණ්ඩ හා සේවාවන්ගේ මිල යම් ඉහළ යෑමකට ලක්වන බව ඇත්තය. නමුත් එය සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යෑමට බරපතල හානියක් නොවන තත්වයකි. මෙහිදී අත්‍යාවශ්‍ය භාණ්ඩ ගණනාවක් බදුවලින් නිදහස්කර එහි බලපෑම අවමකර ඇත. ඒ නිසා බදු මත ඒවායේ මිල ඉහළ යෑමක් සිදු නොවේ. එසේම මෙම භාණ්ඩ මිල තවදුරටත් අවම කිරීම සඳහාද රජය විවිධ පියවරයන් ගනිමින් ඇත. ඒ අනුව ඇතැම් ආර්ථික විද්‍යා මහාචාර්යවරුන් සිය විපක්ෂ දේශපාලනික පක්ශග්‍රාහිත්වය මත ප්‍රකාශ කරන, පවුලක ජීවන වියදම රු.40,000කින් පමණ වැඩි වෙනවා කියන ප්‍රලාපය කිසිසේත් සිදු වන්නේ නැත. එලෙස සිදු විය හැක්කේ මාසිකව ලක්ෂ හත අටකට වැඩි සාමාන්‍ය වියදමක් කරණ ධන කුවේරයන්ට පමණි. එසේම මෙහිදී වඩාත් පිඩාවට පත් වන පිරිස් වෙනුවෙන් සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල ක්‍රියාත්මකය. එසේම රාජ්‍ය සේවකයන් වෙනුවෙන් රු. 10,000ක අමතර දීමනාවක්ද ලබාදෙමින් තිබේ.

### වැට් කියන්නේ මොකක්ද?

වැට් බදු අය කරනේ යම් ප්‍රතිපත්තිමය පදනමක් මතය. වැට් යනු එකතු කළ අගය මත බදුය (Value Aded Tax). එනම් නිෂ්පාදන ක්‍රියාවලිය අවසන, එම අවසන් නිෂ්පාදිතයේ වටිනාකමෙන්, නිෂ්පදනය වෙනුවෙන් බාහිරෙන් ගත් අමුද්‍රව්‍ය මිල අඩු කළ විට ලැබෙන අගයට ඇතුළත් බදුය. සරල නිදසුනකින් පැවැසුවහොත් තිරිගු පිටි නිෂ්පාදනයට ගත් තිරිගු ඇටවල වටිනාකම අඩු කළ විට අවසන් නිෂ්පාදනයට ලැබෙන මිලට අදාල බදුය. තිරිගු නිෂ්පාදනය ගොවියා සිදුකරයි, එයට වෙනත් අගයක් එකතු නොකරයි. නමුත් තිරිගු පිටි නිෂ්පාදනය වෙනත් ව්‍යාපාරිකයකු කර්මාන්ත ශාලාවක දී සිදු කරයි. කර්මාන්ත ශාලාවේ දී එම නිශ්පාදනයට තව අගයක් එකතු වෙයි. ඒ අනුව කර්මාන්ත ශාලාවේ එකතු කළ අගය මත පමණක් වැට් අයකිරීම සිදු කරයි. මෙම බදු ක්‍රමය නිසා එකක් මත එකක් වශයෙන් බදු පිට බදු අය වෙන්නේ නැත. මෙම ක්‍රමයේ වාසිය එයය.

“ වැට් බදු අය කරනේ යම් ප්‍රතිපත්තිමය පදනමක් මතය. වැට් යනු එකතු කළ අගය මත බදුය (Value Aded Tax). එනම් නිෂ්පාදන ක්‍රියාවලිය අවසන, එම අවසන් නිෂ්පාදිතයේ වටිනාකමෙන්, නිෂ්පදනය වෙනුවෙන් බාහිරෙන් ගත් අමුද්‍රව්‍ය මිල අඩු කළ විට ලැබෙන අගයට ඇතුළත් බදුය. සරල නිදසුනකින් පැවැසුවහොත් තිරිගු පිටි නිෂ්පාදනයට ගත් තිරිගු ඇටවල වටිනාකම අඩු කළ විට අවසන් නිෂ්පාදනයට ලැබෙන මිලට අදාල බදුය. තිරිගු නිෂ්පාදනය ගොවියා සිදුකරයි, එයට වෙනත් අගයක් එකතු නොකරයි. නමුත් තිරිගු පිටි නිෂ්පාදනය වෙනත් ව්‍යාපාරිකයකු කර්මාන්ත ශාලාවක දී සිදු කරයි. කර්මාන්ත ශාලාවේ දී එම නිශ්පාදනයට තව අගයක් එකතු වෙයි. ඒ අනුව කර්මාන්ත ශාලාවේ එකතු කළ අගය මත පමණක් වැට් අයකිරීම සිදු කරයි. මෙම බදු ක්‍රමය නිසා එකක් මත එකක් වශයෙන් බදු පිට බදු අය වෙන්නේ නැත. මෙම ක්‍රමයේ වාසිය එයය. ”

ලෝකයේ බහුතරයක් රටවල ක්‍රියාත්මක කරන බදු වර්ගයක් ලෙස වැට් බදු පවතී. නවසීලන්තය වැනි රටක් සලකා බැලු විට එහි ආයිත්තම හතරක් හැර සෑම දෙයකටම වැට් බදු ක්‍රියාත්මකය. බොහෝ රටවල් වැට් ආයිතමයන්ට අයත් භාණ්ඩ හා සේවා ප්‍රමාණය ඉතා ඉහළය. ශ්‍රී ලංකාව ඇත්තේ එයින් සෑහෙන දුරකට පහළ තැනකය.

මෙරට වැට් බදු අනුපාතය ඉහළ දැමීමෙන් පසුවත් රාජ්‍ය ආදායමට

07 පිටුවට

06 පිටුවෙන් එකතු වන්නේ රුපියල් බිලියන 1400ක් පමණය. එය දළ දේශීය නිශ්පාදනයෙන් සියයට 4 තරම් අවම අගයක පවතී. සංවර්ධිත රටවල මෙම අගය සියයට 7 ඉක්මවන බව දකින්න පුලුවන.

### වැට් ගෙවන්න ඕන දැනගෙන

කෙසේ නමුත් වැට් බදු පැනවීමෙන් පසුව සමාජය යම් කැළැඹීමකට පත්ව තිබීම තිව්‍ර කළේ විපක්ෂය මේ ගැන ගෙන ගිය බොරු ප්‍රචාරයන් නිසාය. එසේම මේ මොහොතේ දි ජනතාවගේ තිබෙන නොදැනුවත්භාවය නිසා කුට වෙළඳුන් වැට්... වැට්... කියමින් හිතු මනාපෙ භාණ්ඩ හා සේවාවන්හී මිල ඉහළ දැමීමට කටයුතු කිරීමත් ජනතාවගේ අනවශ්‍ය කළඹලයට හේතු වී ඇත.

මෙහිදී ජනතාව දැනගත යුතු කරුණු කිහිපයක් තිබේ. එනම් වැට් බදු අනුකුල වන්නේ මොනවාටද එය අය කරගන්නේ කෙසේද යන්න ගැන දැනුවත් විය යුතුය. වැට් බදු අය කරන්නේ නම් ඒ සඳහා නියමිත ක්‍රමවේදයක් තිබේ.

ඒ අනුව ව්‍යාපාරිකයන්ට හිතුමනාපෙට තමන්ගේ පාරිභෝගිකයන්ගෙන් වැට් අය කළ නොහැකිය. අදාල ව්‍යාපාරිකයා ඒ සඳහා මුලින්ම වැට් අයකිරීම සඳහා ලියාපදිංචි වී වැට් අංකයක් ගත යුතුය. එසේම වැට් අය කෙරේ නම් පරිභෝගිකයෙකුට එයට අදාල නියමිත බිලක් ලබාදීම විය යුතුය. එහි අනිවාර්යයෙන්ම වැට් ලියාපදිංචි අංකය සඳහන් විය යුතුය. ඒ අනුව පාරිභෝග කයාට කුට වෙළඳුන්ගෙන් පරිස්සම්වීමේ හැකියාව තිබේ.

### 2022 දී රටේ ආර්ථිකය තිබුණ තැන

කොහොම නමුත් වැට් බදු වැඩිවීමේ භයානක අනතුරක් ගැන කතා කරන කවුරුත් 2022 වසරේ රටේ ආර්ථිකය තිබුණ තැන ගැන අමතක කිරීම කණගාටුවට කරුණකි. විශේෂයෙන්ම එදා පැවැති සියයට 70කට ආසන්න අතිඋද්ධමන තත්වය මෙතෙක් කල් පැවැතියා නම් භාණ්ඩ හා සේවා මිල ඉහළ යන්නේ මේ වැට් බද්දෙන් වැඩි වූ සුළු ප්‍රමාණයන්ගෙන් නොවේ. 2019 වසරේ උද්ධමනය සියයට 4කට වඩා පහළ අගයක් තිබු නමුත් 2020 වන විට එය සියයට 6 දක්වාත් 2021 දී 7 දක්වාත් වැඩි වී 2022 වසර තුළ සියයට 70ට ආසන්න විය. එනම් 2022 වසර තුළ පමණක් භාණ්ඩ හා සේවා මිල ගණන් සියයට 70කින් ඉහළ ගොස් ඇති බවය. මේ ඉහළ ගිය මිල ඉදිරි වර්ෂයක දී උද්ධමන වේගය අඩු වුවා කියා අඩුවන්නේ ද නැත. මිල වැඩිවීමේ වේගය පමණක් අඩු වෙයි. බඩු මිල අඩු වන්න නම් සෘණ උද්ධමනයක් නැති නම් අවධමනයක් ඇති විය යුතුය. නමුත් එය සිදුවීම වියහැකි තත්වයක් නොවේ. කෙසේ නමුත් උද්ධමන වේගය අඩු නොවී වසර කිහිපයක් පැවැතුනා නම් ඇති වන තත්වයන් මත බඩු මිල ඉහළ යන්නේ රොකට් වේගයෙනි.

2022 සියයට 70ක් වු උද්ධමන මට්ටම ගැන කතා කරන්නේ 2021 තිබුණු මට්ටම්වලට සාපේක්ෂවය. 2021 දීත් උද්ධමන තත්වය සියයට 7 කට වැඩි විය. ඒ වැඩි වුණ තැන සිට 2022 වැඩි වීම සිදුවිය. එය සරළව පැහැදිලි කළහොත් 2020 වසරේ රුපියල් 100යට මිල තිබුණ භාණ්ඩයක් 2021 වනවිට තිබුණු උද්ධමනයත් සමඟ 107ක් වෙයි. 2022 උද්ධමනය අනුව යළි සියයට 70කින් වැඩි වෙනවිට එය වැඩි වෙන්නේ රුපියල් 100යේ සිට නොවේ. 107 සිට සියයට 70ක් ලෙසය. එවිට මිල 182 පමණ වෙයි. මෙලෙසම 2023 වසරේදීත් සියයට 70ක උද්ධමනය පැවැතුණා නම් එම භාණ්ඩයේ මිල රු 310ක් පමණ වෙයි. එලෙසම මෙම 2024 වසරෙත් පැවැතුණහොත් එය රු 527ක් පමණ වෙයි. අවුරුදු 3 කට කලින් රු 100ට තිබුණ භාණ්ඩයට 527ක් ගෙවන්න සිදුවීම යනු එය සියයට 500 කින් පමණ ඉහළ යාමකි. එයත් උද්ධමනය සියයට 70ක නතර කරගැනීමට හැකිවීම නිසාය. ඒ ඉක්මවා උද්ධමන වේගය වැඩිවීම වැලැක්වීම සහ පසුගිය වසරේදී සියයට 3කට වඩා අවම කිරීම අනුව රු. 100ට තිබූ භාණ්ඩය අද රු. 220කට ආසන්න මිලකට හෝ පාලනය වී ඇත. ජනාධිපති රනිල් රට භාරගැනීමෙන් පසුව උද්ධමනය පාලනය කිරීමට අසමත් නොවුණා නම්, පාන් රාත්තලක් ගන්න විල්බැරැක්ක පුරවලා සල්ලි ගෙනියන්න වෙයි යනුවෙන් එදා කියැවුණේ ඒ නිසාය. උද්ධමනය සියයට තුන් හාරසීය ඉහළ ගොස් ඒ අවුරුදු ගණනක් පුරා පහළ දමා ගැනීමට නොහැකිව සිම්බාබ්වේ, වෙනිසියුලාවේ, ලෙබනනයේ, ග්‍රීසියේ වැනි ආර්ථික අර්බුදයන්ට ගොදුරු රටවල සිදු වූයේ එයය.

එවැනි බරපතල තත්වයකට රට පත් නොකර අද වැට් බදු සියයට 3 කින් වැඩි කිරීම ගණන් ගතයුතු දෙයක් තරම්ද නොවේ. මෙහිදී සියයට 15ට තිබුණු අගය 18 කිරීම සහ මෙතෙක් කල් වැට් නොතිබුණ ආයිත්තම සහ ව්‍යාපාර කිහිපයයක් ඊට එකතු කරගැනීම පමණක් සිදුව තිබේ. ඒ අනුව 2022 වසරේ රු. 182 ක උපරිම මිලකට ඉහළ ගිය භාණ්ඩයට අද සියයට 18 කම වැට් බදු වැදුණාත් ඒ ඉහළ යන්නේ රු. 32 කින් පමණය. වැට් නිසා බඩු මිල වැඩි වෙලා කියා කෑගහන අයට පැවැති ගෝඨාභයලාගේ, ගොඩහේවලාගේ, කබ්රාල්ලාගේ පාලනයම දිගටම පැවැතුනා නම් වෙන්න තිබුණු සන්තැසිය ගැන වගේ වගක් නැත.

කොහොම නමුත් වැට් බදු වැඩි කිරීමට රජයට සිදු වූයේ රාජ්‍ය ආදායම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවීමේ සාධාරණ අවශ්‍යතාවය නිසාය. එහෙත් මෙය බදු පැනවීමේ දුර්වලතාවයක් හෝ රජයේ අකාර්යක්ෂමතාවය නිසා හෝ සිදුවුවක් නොවේ. මන්ද රාජ්‍ය ආදායම පහත වැටීම කෙරෙහි උද්ධමනය අධි වේගයකින් අවම කිරීමට රජය සමත් වීමත් මෙයට බලපා තිබෙන නිසාය.

### ආදායම් ඉලක්කය මග හැරුනේ ඇයි?

උද්ධමනය වඩා වේගයෙන් පහළ වැටීම රට තිබූ තත්වය අනුව ජනතාවට යහපත් දෙයක් වුවත්, එය රාජ්‍ය ආදායම් අඩුවීමට බලපෑම නිසා රජයට අයහපත් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පසුගිය වසරේදි උද්ධමනය පහත වැටිය යුතු ඉලක්කයක් ගැන කතාකර තිබුණද ඒ ඉක්මවා පහළ යෑම සිදුවිය.

2022 වසර අවසාන වෙද්දී උද්ධමනය සියයට 70ක් පමණ විය. එනම් එම වසර තුළ භාණ්ඩ හා සේවා මිල ගණන් සියයට 70කින් ඉහළ ගොස් ඇති බවය. මෙම වැඩිවීම 2023 අවසානයේ දී සියයට 4 දක්වා අඩු වූ විට මිල ගණන් පවතින්නේ වසර මුල ඇස්තමේන්තු කළ මට්ටමට වඩා පහළින්. මේ ආකාරයෙන් ව්‍යාපාරික සමාගම්වල අපේක්ෂා කළ ආදායම් ඇස්තමේන්තු අඩු වී ආදායම් මත අය කරන බදුද අඩු වෙයි. මේ අනුව ආදායම් අවම වීම වන විට, වැට් බදු අය කිරීම සඳහා පදනම් වන වසරකට රුපියල් මිලියන 80කට වඩා ආදායමක් සහිත ව්‍යාපාර කාණ්ඩයට, අසු නොවෙන ව්‍යාපාර ගණන වැඩි වෙයි. එවිට එවැනි ව්‍යාපාර වැට් බදු ගෙවීම සඳහා ලියාපදිංචි වන්නේ නැත. මේ හේතුව ද රාජ්‍ය ආදායම් පහත වැටීමට බලපා තිබිණි.

මේ තත්වය මත වැට් බදු ගෙවීම සඳහා ලියාපදිංචි විය යුතු අවම ආදායම් අගය මිලියන 60 දක්වා පහළට ගෙන ඒම සිදුකර ඇත. මේ ආකාරයේ සංකීර්ණ තත්වයන් රැසක් කළමනාකරණය කරගැනීමක් අනුව මෙවර වැට් අනුපාතය ඉහළ දැමීම සිදුකර ඇත. විපක්ෂයේ ඇතැමුන්ට තිබෙන නොදන්නාකම නිසා වැට් අහෝසි කිරීම් ගැන නන් දෙඩෙව්වත් වැට් අඩුකිරීම මගින් සිදුවන සංකිර්ණ ගැටළු විසඳීම ගැන කතා කරන්නේ නැත. අඩු තරමින් ගෝඨා පාලන සමයේදී වැට් සියයට 8 දක්වා පහත දැමීම සහ පැන නැගුණ අරගලයේදී සිදු වුයේ කුමක්ද යන්නවත් දැන් මතක නැත.

### අඩු විය යුත්තේ බඩු මිල ද උද්ධමනය ද?

එසේම වැට් නිසා වන මිල ඉහළ යෑම, උද්ධමනය යම් වැඩිවීමකට ලක්වන නමුත් වගකිව යුතු රජයක් ලෙස මෙම උද්ධමන තත්වයද සියයට 5 ඉක්මවීමට නොදී පාලනය කිරීමට අවශ්‍ය පියවර රජය ගෙන ඇත. කොහොමටත් සියයට 5 නොඉක්මවීම නීතියක් ලෙස පවතින දෙයක් නිසා මහ බැංකුව හා රජය මීට අවශ්‍ය පියවර ගනු ඇත.

අනෙක් චෝදනාවක් වන්නේ උද්ධමනය අඩු වුණාට බඩු මිල අඩු නොවන බවය. එය ඇත්තය. උද්ධමනය යනු බඩු මිල නොවේ. බඩු මිල වැඩි වැඩි වීමේ වේගයය. බඩු මිල අඩු වේ නම් ඒ




සෘණ උද්ධමනයක් හෙවත් අවධමනයකි. කෙසේ නමුත් රටක අවධමනයක් පැවතීම කිසිසේත්ම හොඳ තත්වයක් ලෙස සැලකෙන්නේ නැත. එය නැවත ආර්ථික අර්බුදයකට මඟ පාදන්නකි. මේ නිසා වේගයෙන් අඩු වූ උද්ධමනය මහ බැංකුව පොලී අනුපාතික කප්පාදු කිරීම වැනි ක්‍රියාමාර්ග හරහා පාලනය කිරීම පසුගිය කාලයේ සිදු විය.

කෙසේ වෙතත් යම් යම් භාණ්ඩවල අනෙක් හේතුවක් මත මිල අඩුවීම් සිදු විය හැකි නමුත් සමස්තයක් ලෙස පසුග ය 2022 වසරේදී විශාල ලෙස ඉහළ ගිය බඩු මිල නැවත ඊට පෙර තිබුණු මට්ටමට අඩු වීම සිදු නොවේ. එය ඉතාම සාමාන්‍ය තත්වයකි. නමුත් වැදගත්ම දේ උද්ධමන අගය විශාල ලෙස අවම කරගැනීමට රජය සමත් වීමය. 2022 වසරේ තත්වය අඛණ්ඩව හෝ ඊටත් වඩා වේගයෙන් 2023 දිත් මෙම වසර තුළත් පැවැතියා නම් දැන් පවතින්නේ රටක් නොව බඩගින්නේ මිනිස්සු මිය ගිය අමු සොහොනකි. උද්ධමනය අඩු කරගැනීමට රජය කළේ මොනවාද කියන එකත් මෙතනදි වැදගත්ය. ඊට කළින් මේ උද්ධමනය ඇති වීමට හේතු වුණ කාරණා මොනවාද යන්න දැනගැනීම විය යුතුය. මන්ද ඒ වැරදි තත්වයන් වැලැක්වීම හා සිදුවූ හානිය පුර්ණ කරගැනීම රජය කරමින් සිටින නිසාය.

### උද්ධමනය ඉබේ ඇති වුණේ නැත

සාමාන්‍යයෙන් උද්ධමනය ඇති වීමට බලපාන හේතු වන්නේ, රජයේ සහ පෞද්ගලික අංශයේ පාරිභෝජන වියදම් හා ආයෝජන වියදම් ඉහළ යෑම, මුදල් සැපයුම, විදේශීය ඉල්ලුම, සේවා නියුක්තිය ඉහළ යෑම මෙන්ම වෘත්තීය සමිති හෝ සේවකයන් විසින් ඉල්ලා සිටින වැටුප් වැඩිවීම් ලබා දීම, ඉහළ මිල මට්ටම් පවත්වාගෙන යන ව්‍යාපාරික ආයතනවල ඒකාධිකාරී වෙළඳපොළ නිසාද උද්ධමනය ඉහළ යෑමට බලපෑම් ඇති කරයි.

මෙරට උද්ධමනය කෙරෙහි වැඩිම බලපෑමක් සිදු කළේ රජයේ සහ පෞද්ගලික අංශයේ පාරිභෝජන වියදම් ඉහළ යෑම නිසා වන ඉල්ලුම වැඩිවීම, රාජ්‍ය ආදායම් අහිමි වීම නිසා මුදල් සැපයුම (මුදල් අච්චු ගැසීම) වැඩි කිරීම වැනි සාධකයන්ය. මේ අනුව මෙම තත්වයන් පාලනය කිරීම සඳහා ඉල්ලුම පාලනය කිරීම විය යුතුව තිබිණි.

මේ සඳහා රාජ්‍ය වියදම් කපා හැරීම, බදු අනුපාත වැඩි කිරීම හා බදු පදනම පුළුල් කිරීම, සහනාධාර කපා දැමීම කළ යුතු විය. එසේම මුදල් සැපයුම පාලනය කිරීම විය. පොලී අනුපාතයන් ඉහළ දැමීම් හරහා බැංකු ණය දීම සීමා කිරීමද මේ අනුව සිදු විය. සාමාන්‍යයෙන් වැටුප් සීමා කිරීමද මෙවැනි තත්වයකදී සිදුකරන නමුත් එම පියවර රජය ගත්තේ නැත. රජයේ සහ පෞද්ගලික අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගත් අතර රජයේ මිල පාලනයන්ද යම් තරමකට ක්‍රියාත්මක විය. වර්තමාන ආර්ථික ප්‍රතිසංස්කරණයන් සිදු වන්නේ මේ අනුවය. බදු වැඩි වීම හා පදනම පුළුල් වන්නේ ඒ අනුවය.

### වියදම් කප්පාදුව ද විසඳුමකි

එහෙත් එතැනින් මේ වැඩේ අවසන් වෙන්නේ නැත. රජයේ වියදම් තවදුරටත් අඩු කරගැනීම සිදු විය යුතුය. විශේෂයෙන්ම රජයේ වියදම් වැඩි පංගුවක් යොදවන්නේ පුනරාවර්ථන නැති නම් පඩි නඩි, සහනාධාර ආදිය ගෙවීමට, පාඩු ලබන ආයතන නඩත්තුවට සහ ණය සහ පොලී ගෙවීමට.

අදත් රජයට දරන්න බැරි තරම් විශාල රාජ්‍ය සේවයක් නඩත්තු කරමින් තිබේ. ඒ අතර බොහෝ අයතනවල අතිරික්ත සේවක සංඛ්‍යාවක් සිටිති. ආරක්ෂ අංශවල ලක්ෂ තුනකට වැඩි පිරිසක් නඩත්තු කෙරේ.

මේ වන විට මෙම අතිරික්තය අවම කිරීම සඳහා සහ ඵලදායිතාවය ගොඩ නැගීමට පිළියම් යෝජනා වී තිබේ. එසේම මේ වන විට විදුලිය, ඉන්ධන වෙනුවෙන් ලබා දි තිබු සහන අහෝසි කර ඇත. පිරිවැය අනුව මිල ක්‍රමයක් හඳුන්වා දී ඇත. රජය ව්‍යාපාර කිරිමෙන් ඉවත්වීමේ ප්‍රතිපත්තිමය තීන්දුව ගෙන ඇත. ඒ අනුව රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් රාජ්‍ය බදු ආදායම් යෙදවීම නුදුරේදි අවසන් වෙනු ඇත. එයාර් ලංකා ඇතුළු දැවැන්ත පාඩු ලබන ආයතන 40ක් පමණ ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා වී ඇත. මෙම පියවර ක්‍රියාත්මකවීමේදි රජයට සමාජ ආරක්ෂණ කටයුතු, පොදු පහසුකම් සංවර්ධනය, අධ්‍යාපනය සෞඛ්‍ය වැනි සේවා වෙනුවෙන් වැඩි දායකත්වයක් ලබාදීමේ හැකියාව නිසැකවම ලැබෙනු ඇත.

රාජ්‍ය වියදම් සීමා කර බදු පදනම් පුළුල් කර රාජ්‍ය ආදායම් වර්ධනය කරගැනීමේ වාසිය නැවත ලැබෙන්නේ ජනතාවටමය. සමාජ සාධාරණත්වය මුල් කරගත් රජයේ නව වැඩ පිළිවෙල දියත් කිරීමේ ප්‍රතිලාභය ජනතාවට ලැබෙනු ඇත. "වැට් වැඩිවීම නිසා ලැට්වලින් වැඩක් නෑ" කියන මේ දිනවල ජනප්‍රිය පාඨය සත්‍ය වශයෙන්ම සංශෝධනය විය යුත්තේ "වැට් නැති වුණා නම් ලැට්වලින් වැඩක් වෙන්නේ නැත" කියාය. මන්ද මේ ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක නොවන්න අද ලැට් යන්න තියා කෑම වේලක් හොයා ගන්නවත් නොමැති තැනට රට ඇද වැටීමට විශාල ඉඩක් තිබුණු නිසාය.

මේ අතර බදු ආදායම් හොරකම් කරනවාය, නාස්තිකරනවාය කියන ජනප්‍රිය චෝදනාව යළි නොනැගෙන්නට ද රජය පිළියම් යොදා ඇත. ඒ සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණයන් රැ සක් දැන් ක්‍රියාත්මකය. එසේම නව නීති ප්‍රතිපාදනයන් රැසක්ම මෙම වසර තුළදී ගෙන ඒමත් සිදු වෙනු ඇත. රජයේ ආදායමෙන් වැය කරන සෑම රුපියලකට වගවන සහ ඒ විනිවිද භාවයෙන් යුතුව සිදු කිරීමට අවශ්‍ය ක්‍රමවේදය සහිත පියවරන් ගෙන ඇත.

මේ අනුව වැට් බදු ගැන කරන නහයෙන් හැඬීම මේ මොහොතේ විපක්ෂයේ පටු අවස්ථාවාදී දේශපාලනයට වාසිදායක වුවත් රට පැත්තේ හිතන විට එය රටට කරන ද්‍රෝහිකමකි. රජය අද ගෙන තිබෙන ආර්ථික ප්‍රතිසංස්කරණයන්ගේ අනාගත ප්‍රතිලාභයන් ගැන බහුතර ජනතාවකට මේ මොහොතේ අවබෝධය අවම වුවත් මේ වසර අවසන් වන විට තමන් රටේ ආර්ථිකය ගොඩනැංවීම වෙනුවෙන් පිඩාවන් දරාගෙන කළ කැපවීමෙහි ප්‍රතිපල ලැබෙනු ඇත. එය සහතික කර කිවහැක්කේ මෙතෙක් එනම් ජනාධිපති රනිල් බලයට පත් වී මෙම වසර එකහාමාර තුළදී රට ගොඩනැගීම වෙනුවෙන් ගත් පියවරයන්හී අති සාර්ථකත්වය මත අනාගතයත් සාර්ථක වීම හැර වෙනකක් වීමට ඉඩ නොමැති නිසාය.

ජයතුංග බණ්ඩාර

# කයිවාරු හැර
# වමට කිසිවක් බෑ




වත්මන් ශ්‍රී ලංකාවේ දේශපාලනය විවිධාකාර මුහුණුවර සමඟ ක්‍රියාත්මක වූවද සත්‍ය ලෙසම පවතින්නේ වම දකුණ අතර තරගයකි. ඒ බව මේ දිනවල පවතින දේශපාලන සංවාද හා ප්‍රවණතා අනුව පෙනෙන්න තිබේ. විශේෂයෙන්ම රට මුහුණ දුන් ආර්ථික අර්බුද හමුවේ ජනතාවට කරගසන්නට සිදුවූ පීඩනයන් උත්සන්න වීමත් සමඟ ස්වභාවයෙන්ම ගොඩනැඟෙන ආණ්ඩු විරෝධය ජනප්‍රිය වම තුළට ඇදා ගැනීමට සමත්වීම විසින් මෙම තත්වය ඇතිකර ඇත. රට ආර්ථික වශයෙන් කඩාවැටීම කෙරෙහි බලයේ සිටි සහ නොසිටි සියළු පාර්ශ්ව අඩු වැඩි වශයෙන් වගකිව යුතුවීම පැහැදිලි සත්‍යය වුවත්, බහුතරයක් ජනතාව දේශපාලනය තේරුම් ගන්නා අතිශය සරළ නිර්ණායක අනුව මෑත භාගයේදී ආණ්ඩුකරණයට සම්බන්ධ වූ කොටස් මත වරද පැටවීමට ඉක්මන්ව තිබේ. මේ නිසා රෝස මලෙන් උපන් කුමරාසේ වෙස් ගෙන සිටින අනුර කුමාර සහ ඔහුගේ ජනතා විමුක්ති පෙරමුණට, ජාතික ජන බලවේගය නමින් ලිබරල් පෙනුමක් ඇති ජනප්‍රිය දේශපාලන බලවේග යක් ලෙස පෙනී සිටීමේ ඉඩක් නිර්මාණය කරගැනීමට හැකි වී ඇත. නමුත් මෙය පරණ වාමාංශික ජාතිකවාදී ව්‍යාපාරයමය. එය ඇස් නිලංකාර කරන ඉන්ඩිගෝ වර්ණයකින් වසා ඇත. මහා ඝෝෂාවකින් සත්‍යයේ හඬ යටපත් කර ඇත. යා යුතු මඟ පැහැදිලිව තිබියදී බැදිවල සැරිසරන්න යෝජනා කරමින් තිබේ. කෙසේ නමුත් මෙය තවත් උගුලකි. මෙයට ජනකොටස් හසුවීම යළිත් සිදුවන බරපතල වරද්දාගැනීමකි.

සියලල්ටම වඩා ආර්ථික වශයෙන් අර්බුදයක තිබෙන රටක, අර්බුදය වලක්වා ගැනීම වෙනුවෙන් සංකීර්ණ, දුෂ්කර ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් සුක්ෂමව දියත්වෙමින් තිබියදී යම් ලෙසකින් එය කඩාකප්පල් කරන බලවේගයක් වෙතට රාජ්‍ය බලය මාරු වුවහොත් විය හැකි දේ ගැන අවබෝධයක් එම ජනප්‍රිය දේශපාලන සුකුරුත්තම පස්සෙන් වැටී සිටින ජනතාවට ඇතැයි සැක සහිතය. අනෙක විශේෂයෙන්ම මෙරටේ වාමාංශික දේශපාලන දැක්මේ පදනම මහජාතියේ ජාතිවාදී ස්ථාවරයන් සමඟ මුසුව තිබෙන ඊනියා ජාතිකවාදයක් ලෙස ගොඩනැඟී ඇති විට තත්වයන් තවත් අනතුරුදායකය. මේ රටේ නිදහසෙන් පසුව ගෙවුණු වසර 75 තුළ රට පාලනය කිරීමේදී වැඩිම අහිතකර බලපෑම කළේ මේ වාම ජාතිකවදීන්ය. රටේ දියුණුව අඩපණකරන තැනට ඇද දැමුවේ ඔවුන්ය. මෙහි අවසාන අවස්ථාව පසුගිය ගෝඨා පාලනයයි. ගෝඨා පාලනය යනුද වාම ජාතිකවාදය කරපින්නා ගත් විකෘති පාලන ක්‍රමවේදයක් අනුගමනය කළ අවස්ථාවකි. එය ජවිපෙ ලිබරල් අයිසිං කේක් ගෙඩිය වූ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තිවලින් වෙනස් වන්නේ නැත. නමුත් ජාජබය නමින් වෙස්මාරුකර ගත් ජවිපෙ ප්‍රතිපත්තිය වන්නේ සමාජ විප්ලවයක් හරහා ගොඩනගන ආඥාදායක සමාජවාදයකි. මේ නිසා ලිබරල් නාමයෙන් මේ ජනප්‍රිය වාම ජාතිකවාදීන් අතට බලය යෑම අනිවාර්ය විනාශයකට පාර කපාගැනීමක් මිසක් වෙනකක් වන්නේ නැත. එසේම යළි මතක් කළ යුතු දේ නම් මේ වාම ජාතිකවාදින් මේ රට ආගාධයට ඇද දැමූ සෑම මොහොතකම යළි රට ගොඩදැමීමේ කර්තව්‍යය සිදුවූයේ දක්ෂිණාංශික දේශපාලන ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කළ අවස්ථාවලදී පමණක් බවය.

මෙය මේ රටට පමණක් සුවිශේෂි තත්වයක් වන්නේ නැත. ලෝකය පුරාම අත්දැකීම මෙයය. ඊට උදාහරණ ඇති පදමට තිබේ. වාමාංශික දේශපාලනයේ ප්‍රදර්ශනකාමී ජනතාවාදය ජනප්‍රියය. ඒ නිසා බලය අල්ලාගැනීමේ පහසු අවස්ථා ඇත. නමුත් ඔවුන් ගොඩදැමූ රටක් නැත. සියල්ල අඛණ්ඩ පැවැත්මක් නොමැතිව අසාර්ථකව කඩාවැටීම සිදු තිබේ. හරියට ස්වභාවධර්මයට විරුද්ධව කටයුතු කළ නොහැකිවාක් මෙනි. ස්වභාවධර්මයාට එරෙහිව කටයුතු කිරීමේ විපාක ලෙස අද දේශගුණික විපර්යාස විසින් ලෝකයම බරපතල අනතුරකට ලක්කරමින් එහි ශක්තිය පෙන්වා ඇත. ඒ නිසා ස්වභාවධර්මය සමඟ සහජීවනයෙන් එය ආරක්ෂා කරන ගමන් යන ගමනක් හැර ලෝකයට වෙන විකල්ප අදත් නැත. දක්ෂිණාංශික දේශපාලනය කියන්නේ මිනිස් ස්වභාවිකත්වයේ නිදහස් දේශපාලනයයි. වාමාංශය කියන්නේ මිනිස් ස්වභාවිකත්වයේ දේශපාලනය මර්දනය කිරීමයි.

සාමාන්‍යයෙන් වාමාංශික කියන පොදු ආමන්ත්‍රණයෙන් හඳුන්වන දේශපාලනය ඒකාකාර නැත. ඉතිහාසය තුළ සහ භාවිතාව තුළ ඊට විවිධ අර්ථකතන ලැබී ඇත. වම - දකුණ දේශපාලනික බෙදීම 18 වෙනි සියවසේ ප්‍රංශ විප්ලවයෙන් පසු පැන නැගුණු තත්වයන් සමඟ නිර්මාණය වුවක් ලෙස සැලකේ. පවතින සාම්ප්‍රදායික පිළිවෙත පිළිගන්නා පාර්ශ්වය දක්ෂිණාංශිකය ලෙසත් ඊට වෙනස්ව ඒ තත්වයන් වෙනස් කරන දේශපාලනය වාමාංශික විය. කලෙක අමරිකානු ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය හැඳින්වූයේද වාමාංශික දේශපාලනයක් ලෙසය. අද එය දක්ෂිණාංශික වන්නේ ඊට එරෙහි වෙනත් මතවාදයන් නිර්මාණයවීම මතය. විශේයෙන්ම කාල් මාක්ස් ආදීන් විසින් ගොඩනැගූ ධනවාදයට එරෙහි දේශපාලන හා ආර්ථික මතවාදයන් නිසා සමාජවාදී දේශපාලන ප්‍රවණතා වාමාංශික විය. කොහොම නමුත් සමාජවාදය හෝ ධනවාදය, අන්තගාමී ස්ථාවරයන් අනුව කටයුතු කිරීමක් ලෝකයේ විරල අතර බොහෝ විටම මිශ්‍ර ආර්ථිකයක් නමුත් පැත්තට බර වීම අනුව දක්ෂිණාංශිකද වාමාංශිකද යන්න තීරණය විය. එය තීරණය කිරීමේ දී ජාතිවාදය ආගම්වාදය වැනි පටු ස්ථාවරයන් ද බලපෑම් සහගත විය.

කෙසේ නමුත් කවර තත්වයන් යටතේ වුවත් රාජ්‍යයක් පවත්වාගෙන යෑමේදී වඩා වැදගත් වන්නේ අනුගමනය කරන ආර්ථික පිළිවෙතය. රටක් ගොඩනගනවාද කඩා වැටෙන්න හරිනවාද තීරණය වන්නේ ආර්ථික ප්‍රතිපත්ති මතය.

ලෝකයේ සමාජවාදයට, ජාතිකවාදයට බර වූ පාලන ක්‍රමයන් පවත්වගෙන ගිය රටවල් කෙටිකාලීනව ඇතැම් ක්ෂේත්‍රවල ජයග්‍රහණයන් ලබාගැනීම සිදුව තිබේ. ඒවා වැඩි උත්කර්ශයට නැංවීම සිදුව ඇති නමුත් සමස්තයක් ලෙස සලකා බැලීමේදී එම ජයග්‍රහණයන්ගේ වාසිය, රටේත්, ජනතාවගේත් තිරසාර සංවර්ධනය වෙනුවෙන් හෝ යොදාග ැනීමට එම දේශපාලන ආර්ථික ක්‍රමය විසින්ම වලක්වා, එම රාජ්‍යයන් අසමත් රාජ්‍යයන් බවට පත්කර ඇත.

ලෝකයේ පළමු සමාජවාදී රාජ්‍යය වන්නේ රුසියාවය. ඒ සමඟ ගොඩනැගූ සෝවියට රුසියා සමූහාණ්ඩු රාජ්‍ය පද්ධතියම (සෝවියට් දේශය) මුල් අවස්ථාවේදී සමාජවාදී සංවර්ධනයක් අත්පත් කරගත්තද එය මුළුමනින්ම කඩා වැටිණි. එසේම එම සංවර්ධනය අත්පත් කරගත්තේ ජන සමාජයම වහල් කඳවුරක් බවට පත්කරමිනි. එමෙන්ම සෝවියට් දේශයේ සමාජවාදී සංවර්ධනය වෙනුවෙන් මිලියන් සිය ගණනක ජනතාවකට රාජ්‍ය බලහත්කාරයට යටවී ජීවිත පුදන්න සිදුවූ බවත් කිව යුතුය. මිනිසුන්ගේ නිදහස, අයිතිවාසිකම මර්දනය කිරීම විය. මැතිවරණ නැත. තනි පක්ෂයක් රට පාලනය කළේය. ප්‍රජාතන්ත්‍රවාදී කියා දෙයක් තිබුණේ නැත. තමන්ට කැමැතියි කියා කලාවක් රස විඳීමේ අවස්ථාවත් නොවීය. ආගමක් ඇදහීමේ නිදහස සීමා විය. කෑමක්, බීමක්, ඇඳුමක්, පැළඳුමක් හෝ රාජ්‍යයේ සීමාසහිතකම්වලට යටත් විය. ලෝකය සමඟ ගනුදෙනුව සීමා විය. ඊට බිය විය. පෞද්ගලික දේපොළ අයිතියක් තිබුණේ නැත. සෝවියට් දේශ රාජ්‍ය පද්ධතිය, චීනය, උතුරු කොරියාව, වියට්නාමය. ලාඕසය, කියුබාව හා අනෙක් ලතින් අමරිකානු රටවල සමාජවාදී රාජ්‍යයන් සියල්ලේම අත්දැකීම එකමය. එසේම මැතිවරණ හරහා ආණ්ඩු බලය අල්ලාගෙන සමාජවාදී ආණ්ඩු බිහි කළ රාජ්‍යයන්හි තත්වය ඊට වඩා විකාර සහගත විය. චිලි රාජ්‍යයෙන් ආරම්භ වූ මෙම සමාජවාදී මැතිවරණ ආණ්ඩු ප්‍රවණතාවය විසින් ලෝකයට වැඩිම විනාශය අත්පත් කරදුන් දේශපාලන භාවිතය හා මතවාදය ලෙස හැඳින්විය හැකිය. මේ නිසා දශක ගණනාවක් පුරා එකදිගට අඩපණව තිබෙන රාජ්‍යයන් ගණනාවක් බිහි විය. අද ශ්‍රී ලංකාව බංකොලොත් කරන තැනට ගොදුරුව ඇත්තේත් එම ප්‍රවණතාවයේ ආනුභාවයෙනි. සෝවියට රාජ්‍ය පද්ධතිය පවත්වාගෙන යෑමට නොහැකිව එම දේශපාලන ආර්ථික ක්‍රමයේ තර්කානුකුල ප්‍රතිපලයක් ලෙස කඩාවැටීම සිදුවීමත් පසුව එහි අනුග්‍රහයෙන්, බලහත්කාරයෙන් පවත්වාගෙන රැකගෙන ගිය සෙසු සමාජවාදී හා ඊට හිතවත් කඳවුරම අර්බුදයට ලක් වීය. ශ්‍රී ලංකාව ද අයත්ව එම ඊනියා සමාජවාදී ආණ්ඩු රැසම සෝවියට් දේශය සමඟ එක් රැයකින් කඩා වැටුණේ මේ සමාජවාදී ආර්ථික ක්‍රමයේ මිත්‍යාව පසක් කරමිනි. අද චීන සමාජවාදය වෙනම එකකි. එය ඒකාධිකාරී පාලන ක්‍රමයක් මඟින් සමාජවාදයේ නාමය යටතේ ධනේෂ්වර සංවර්ධනය අත්පත් කරගනිමින් තිබේ. උතුරු කොරියාව අනන්තගාමී ලෙස දැඩි පාලනයක් මත සමාජවාදය නමින් රාජ්‍යයක් පවත්වගෙන යයි. කියුබාවත් එලෙසය. වියට්නාමය, ලාඕසය වඩා නම්‍යශීලීව ධනේෂ්වර සංවර්ධනයට මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයට නැඹුරුව තිබේ. සමාජවාදී හෝ වාමාංශික හෝ නමින් පවත්වාගෙන ගිය රාජ්‍යයන් සියල්ලම අර්බුදයට ගිය නමුත් ධනවාදී සංවර්ධනය අත්පත් කරගත් සමාජවාදී ප්‍රතිපත්ති ලෙස සැලකෙන ඉහළ සමාජ සුබසාධනයන් සහිත රාජ්‍යයන් කිහිපයක්ද තිබේ.

ඒ අනුව ස්වීඩනය, ඩෙන්මාර්කය, නෝර්වේ, ෆින්ලන්තය සහ අයිස්ලන්තය වැනි නෝර්ඩික් රටවල ක්‍රියාත්මක සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ද වාමාංශික යැයි හැඳින්වීමක් තිබේ. එම රටවල් වාමාංශික ප්‍රතිපත්ති සහ ධනවාදී වෙළඳපොළට නැඹුරු ආර්ථික ක්‍රමයක් ක්‍රියාවට නංවා ඇත. ඔවුන් සමාජ සුබසාධනය, සෞඛ්‍ය සේවය, අධ්‍යාපනය, ශ්‍රම ආරක්ෂණය සහ පුළුල් සමාජ ආරක්ෂණය සඳහා ප්‍රමුඛත්වය දී ඇත. නමුත් මේ වෙනුවෙන් ආදායමෙන් සියයට පනහා, හැට, හැත්තෑව වැනි ඉහළ අගයන්ගෙන් ලෝකයේ වැඩිම බදු අය කරන රාජ්‍ය ලැයිස්තුවේ මුලින්ම ඇත්තේ මේ රාජ්‍යයන්මය. කොහොම නමුත් දැඩි නීති රීති සහිත ක්‍රම පද්ධතියක් යටතේ ඇති තත්වයක් වන අතර ඒ ආදර්ශයන් කරගැනීමේ හැකියාවත් ලෝකයේ වෙනත් රාජ්‍යයන්ට ඇතැයි කිව නොහැක.

වාමාංශික ආණ්ඩු, සමාජ සාධාරණත්වය, සේවක අයිතීන් සහ මහජන සුබසාධනයට මුල්තැන දෙන ප්‍රතිපත්තියක් ගැන කතා කරයි. ආදායම් අසමානතාවය හා දරිද්‍රතාවය පිටුදැකීම, සෞඛ්‍ය, අධ්‍යාපනය, පාරිසරික සංවර්ධනය, විරැකියා ප්‍රතිලාභ, සමාජ ආරක්ෂණය, නිවාස ආධාර, ආහාර සහනාධාර වැනි මූලික ජීවන මට්ටමක් සැපයීම සඳහා ආධාර ආදිය මුල්කරගෙන සමාජ හා ආර්ථික ප්‍රශ්න විසඳීම රජයේ භූමිකාව ලෙස සලකයි.

මේවා කතාවට ලස්සනය. නමුත් ආණ්ඩු අර්බුදයට යන්නේම මේ වෙනුවෙන් වන දැවැන්ත වියදමට සරිලන ලෙස රාජ්‍ය ආදායම් උපදවා ගැනීමට අසමත් වීමෙනි. මේ රටවලට ඉහළ බදු අයකිරීම් සඳහා දේශීය ආර්ථිකයක් හෝ විශාල ආදායම් ඉපදවිය හැකි පොසිල ඉන්ධන වැනි ස්වභාවික සම්පත් ප්‍රමාණයක් අපනයනයට හෝ නොතිබෙන විට අර්බුද පැටවු ගසයි.

කොහොම නමුත් ඉහළ බදු, දැඩි රාජ්‍ය නියාමනය වැනි වාමාංශික ප්‍රතිපත්ති මඟින් ආර්ථික වර්ධනය අඩාල කරන අතර පුද්ගලික ආයෝජන, විදේශ ආයෝජනයන් අධෛර්යමත් කරයි. රාජ්‍යයේ ධනය හා සම්පත් අධික ලෙස යළි බෙදාහැරීම නිසා (සහනාධාර හා නොමිලේ සේවා) ඵලදායිතාව සහ ව්‍යවසායකත්වය අඩපණ කරයි. රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පවත්වාගෙන යෑම දුෂ්කර වේ. සමාජ සුබසාධන වැඩසටහන් සහ පොදු සේවාවන් පුළුල් කිරීම නිසා රාජ්‍ය වියදම් සහ අයවැය හිඟය වැඩි කිරීමට හේතු වේ. ඒ අනුව රාජ්‍ය ණය, උද්ධමනය සහ ආර්ථික අස්ථාවරත්වයට ඇති වේ. එසේම රජයේ මැදිහත්වීම සහ රජයේ අයිතිය කෙරෙහි වාමාංශික ආණ්ඩුවල වැඩි අවධාරණය නිසා වෙළඳපොළ එක තැන පල්වෙයි. පුද්ගලික ව්‍යවසාය සමඟ එන නවෝත්පාදන, තරගකාරිත්වය සහ ඉහළ කාර්යක්ෂමතාව සහිත භාණ්ඩ හා සේවා වෙනුවට රාජ්‍ය පාලිත කර්මාන්ත හා සේවාවන් ආර්ථික සංවර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යෑමට සමත් වන්නේ නැත. යම් තැනක ඒ සියල්ල හිරවී සමස්ත පද්ධතියම කඩා වැටීම සිදුවේ.

අනෙක් වැදගත් කරුණ නම් විශාල රාජ්‍ය මැදිහත්වීමකින් සහ නියාමනයකින්, පුද්ගල නිදහස සහ පුද්ගලික තේරීම්වලට ඇති විය හැකි අනතුරය. වාමාංශික ප්‍රතිපත්ති මඟින් ආර්ථික නිදහස, ව්‍යවසායකත්වය සහ පුද්ගලයන්ට තමන්ගේ තීරණ ගැනීමේ හැකියාව සීමා කරයි. එසේම වාමාංශික ආණ්ඩු විසින් දක්ෂිණාංශික පක්ෂ, මතවාද සහ ඒ කෙරෙහි උනන්දුවක් දක්වන කණ්ඩායම්වලට ස්වභාවයෙන්ම දැඩි විරෝධයක් දක්වයි. මෙම විරුද්ධ බලවේගවලට බාධා කිරීම, මර්දනය කිරීම ඉතිහාසය පුරා අනිවාර්යෙන්ම දකින්නට තිබූ ලක්ෂණයකි. මේ නිසා මිලියන සිය ගණනකට ජීවිත අහිමිව තිබේ. කෲර වධ බන්ධනයට සහ ජීවිත කාලය පුරා සිර ගෙවල්වල ලැගීමට සිදුවූ ලක්ෂ ගණනක් සිටී. මේ තත්වයන් මත වාමාංශික ආණ්ඩුවලට සමාජයේ බොහෝ කොටස් වෙතින් දැඩි විරුද්ධත්වය පළවේ. මේ අනුව වන දේශපාලනික සහ මතවාදී වෙනස්කම් සමාජ නොසන්සුන්තාවයට, විරෝධතාවලට සහ රජයේ නීත්‍යානුකූලභාවයට අභියෝග කිරීම සිදු වේ.

මේ අතර ගෝලීය ආර්ථික බලවේග සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන වඩාත් නිදහස් වෙළඳපොළ හිතකාමී ප්‍රතිපත්ති අනුගමනය කිරීම මත වාමාංශික ආණ්ඩුවලට ඒ සමඟ කටයුතු කිරීමේ හැකියාව ඉතා සීමාසහිත වෙයි. විදේශීය ආයෝජකයින් වාමාංශික ප්‍රතිපත්ති සමඟ වැඩකරන්න පැමිණෙන්නේ නැත. රාජ්‍ය නියාමනය ඉවත් කිරීම සහ පුද්ගලීකරණය, නොමැතිව ගෝලීය ආර්ථිකය සමඟ සම්බන්ධවීමේ අවස්ථාව අහිමි වේ. අඩු තරමින් සාර්ථක අපනයන ආනයන වෙළඳාමක් වුව පවත්වාගෙන යෑම දුෂ්කර වෙනු ඇත.

මේ කවරක් වුවත් වාමාංශික ප්‍රතිපත්ති සහිත පාලනයක් ක්‍රියාත්මක කිරීමේ දී ඊට ආවේනික තවත් අභියෝග පවතී. ඒ රාජ්‍ය නිලධාරිවාදය, අකාර්යක්ෂමතාවය, දූෂණය, වංචාව, නාස්තිය, ආයතනික ධාරිතාවේ ඌනතා ආදියය. මේවා විසඳාගැනීමට එම ක්‍රමය විසින් ඉඩක් ලබා දෙන්නේ නැත. මන්ද වාමාංශික ප්‍රතිපත්ති සහිත රාජ්‍ය පාලනයක් යනුම මේ රොඩුබොඩු පමණක් ඉතිරි කරවන්නක් වන බැවිනි.

ඉහතින් සඳහන් කළ සියළු තත්වයන්ට උදාහරණ ඕනෑ තරම් මේ ලෝකයේ තිබේ. විශේෂයෙන්ම මෑත දශක කිහිපය තුළ ගෝලීය වශයෙන් වන දේශපාලන ආර්ථික ප්‍රවණතා මෙන්ම තාක්ෂණික දියුණුව ආදී සාදක මත මේ වාමාංශික ජාතිකවාදී පාලනයන් පවත්වාගෙන යෑම තවදුරටත් අනුමත කළ හැකි තත්වයක නැත. වමේ ආණ්ඩුවකින් රටවල් සංවර්ධනය කළ හැකිය යන්න නූතනයේ ලොකුම ප්‍රලාපයකි. මේ අනුව වමාංශික දේශපාලනය විසින් කඩා ඉහිරවා දමා තිබෙන රටවල් කිහිපයක අත්දැකීම් ඉදිරියේදී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

**මතු සම්බන්ධයි**

**ප්‍රභාත් ජයසුමන**




2024 යනු අරගල වසරකි. එය රටේ මිනිසුන්ගේ ජීවන තත්වයන් උසස් කරනු ලබන, රටේ සංවර්ධනය වෙනුවෙන් ගතයුතු අත්‍යවශ්‍ය පියවරයන්ගෙන් යුතු අරගලයක් විය යුතුය. රටේ ඉරණම තවත් අභාවාවකයකට, දරුණු බේදවාචකයකට තල්ලු කරන්න ගන්නා උත්සාහයන් පරාජය කරන අරගලයක් විය යුතුය.

2023 වර්ෂය අවසානයත් සමඟ මේ රටේ වාමවාදී යැයි කියාගන්නා කණ්ඩායම් විසින් සංවිධානාත්මකව සමාජයට ඒත්තු ගන්වමින් සිටියේ, ඉදිරි වර්ෂය යනු අරගල වසරක්, ඒ සඳහා සූදානමින් සිටින්න යනුවෙනි. ඒ පසුග ිය වසර ඇතුළත ඔවුන් විසින් අත්පත් කරගත් දේශපාලන අසාර්ථකත්වය වසාග ැනීම වෙනුවෙන් වූ සටන් පාඨයක් මිස සැබැවට සමාජ සන්ධර්භයට සුගතියක් අත්කර දීමේ අටියෙන් සිදුකරන ලද්දක් නොවන බව පැහැදිලි කරුණකි. ඒ බව ඔවුන්ගේ මෙතෙක් ප්‍රචණ්ඩකාරී භාවිතාව විසින් පසක් කරතිබෙන බැවිනි.

එකී ප්‍රචණ්ඩකාරී සටන් පාඨයට එහා යමින් ප්‍රජාතන්ත්‍රවාදී යැයි කියාගන්නා ජනතා විමුක්ති පෙරමුණේ නායකයා වසර ආරම්භයත් සමඟ පවසා සිටියේ, මේ වසර **DO OR DIE** වර්ගයේ සටනක් සිදුකිරීමට සූදානම් විය යුතු බවය.

මේ දෙපාර්ශ්වයේම අරමුණ එකකි. ඒ පවතින ක්‍රමය පෙරළා අලුත් ක්‍රමයක් හෙවත් සිස්ටම් චේන්ජ් කිරීමය. ඒ සඳහා ඔවුන් තොරාගෙන ඇති එකම මඟ නම්, වත්මන් රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව පෙරළා තමන්ගේ අණසක යටතේ ක්‍රියාත්මක වන දේශපාලන බල පද්ධතියක් ගොඩනැගීමය. පසුගිය වසර එකහමාරක පමණ කාලයක් පුරා ඔවුන් උත්සාහ දැරුවේ ද ඒ සඳහාමය. නව වසර ආරම්භයත් සමඟ නැවත අලුත් වටයකින් ඔවුන් සිය අරමුණ දිනාගැනීම වෙනුවෙන් අරඅඳින්නේ, ප්‍රචණ්ඩත්වය මුසු මාරාන්තික සටන් ක්‍රියාමාර්ග ඔස්සේම බව පැහැදිලිය.

If you want to change the system. change the system. Itzs no good shooting people. - John Lennon

(ඔබට පද්ධතිය වෙනස් කිරීමට අවශ්‍ය නම්, පද්ධතිය වෙනස් කරන්න. මිනිස්සුන්ට වෙඩි තියන්න හොඳ නෑ. -ජෝන් ලෙනන්)

### පසුබිමේ කතාව

මේ පසුබිමේ කතාව අද සිට තවත් වසර කිහිපයක් අතීතයට අයිති සිදුවීම් ජාලයක එකතුවකි. එනම්, වසර 2019ට මේ රටේ අති බහුතරයක් මිනිසුන් සමුදුන්නේ, ජයග්‍රාහී රාජපක්ෂවරයකු පාලකයකු ලෙස පත්කරගැනීමේ ප්‍රීතියෙන් ඔල්වරසන් දෙමිනි. තම තමන්ගේ සතුට තාප්ප පුරා විසිතුරු ලෙස චිත්‍රයට නගමින්ය. සැබැවටම ඔවුන් එදා විශ්වාස කළ දෙය නම් තමන් උපරිම කැපවීමෙන් 'සිස්ටම් චේන්ජ් කළා' කියාය. අවාසනාවට ඒ මිනිසුන්ගේ විශ්වාසයට වැඩි ආයුෂ තිබුණේ නැත. තමන් පත්කරගත් විජයග්‍රාහී පාලකයා අසාර්ථක නායකයකු බව ඉතාම කෙටි කාලයක් ඇතුළේ ඔප්පු කරමින් සිටියේය.

එකී විජයග්‍රාහී නායකයාගේ දුර්දාන්ත පාලනයට එරෙහිව පළමු අවි එසවීම සිදුවූයේ ද ඔහු නියෝජනය කළ කඳවුර ඇතුළේමය. (ඒ ඔවුන්ට අවස්ථා අහිමි වීම නිසා ද විය හැක) නමුත් ආණ්ඩු විරෝධය සමාජය පුරා පැතිර ගියේ ඉඩෝර සමයක හටගත් ලැව් ගින්නක් මෙනි. පෙර නොවූ විරූ ලෙස මහජනතාව පාරට බැස ආණ්ඩු විරෝධී සටන් පාඨ කියවන්නට විය.

එකී සමයේ තැන තැන ගෑස් පෝලිම් ය, තෙල් පෝලිම් ය, විදුලිය නැතිව මිනිසුන් අඳුරේය, කණකර අතේ දරාගත් මිනිසුන් උගස් පෝලිම්වල ය, කුඩා දරුවන් අතරදී මව්වරු කිරිපිටි පෝලිම්වල ය, වැසුණු පාසල් නිසා දරුවෝ අකුරු සොයා ගස්ගල් උඩය එහෙත් ආණ්ඩුවට පිළියමක් නොවීය. විපක්ෂයට ද විකල්ප අදහසක් උත්තරයක් නොවීය. ඇතැමුන් පාරේ සටන ප්‍රචණ්ඩ කළේය.

රට මුහුණ පා සිටින අර්බුදයෙන් ගොඩ ඒමට සුදුසුම සහ එකම විකල්පය යෝජනා කර සිටියේ, පාර්ලිමේන්තුවේ තනි මන්ත්‍රීවරයකුව සිටි රනිල් වික්‍රමසිංහය. එහෙත් එදා කිසිවකු එය පිළිගැනීමට සූදානම් නොවීය. පාලකයන්ට එදා එය මදිපුංචිකමක් සේ දැනුණා ද විය හැකිය.

නමුත් ආණ්ඩු විරෝධී මහපාරේ අරගලය ගාලුමුවදොර හරහා රට පුරා ගිනි තියන, පාලකයන් පන්නන, මන්දිර වටලන දරුණු ප්‍රචණ්ඩත්වයක් දක්වා පැතිර ගියේය. අවසානයේ අර්බුදය විසින් 225ක් වූ පාර්ලිමේන්තු නියෝජිතයන් අතරින් එකම විසඳුම් යෝජනාව ඉදිරිපත් කළ රනිල් වික්‍රමසිංහ රටේ පාලකයා ලෙස පත්කර ගත්තේය. එය ප්‍රචණ්ඩකාරීන් හැර අන් සියලු මිනිසුන් ඉවසා සිටියේය. ඒ බහුතරය රනිල්ව විශ්වාස කොට නැවත සුපුරුදු ජීවන රටාව බලාපොරොත්තුවෙන් අරගල බිමෙන් ඉවත් විය.

### රනිල්ගේ පාලනය

රටේ ජනාධිපති ධූරය භාරගත් රනිල් වික්‍රමසිංහ මුහුණ දුන් කෙටිකාලීන පළමු අභියෝගය නම් රටේ මිනිසුන්ට එදිනෙදා කටයුතු කිරීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා හිඟය අවසන් කර සමස්ත සමාජය සාමාන්‍යකරණය කිරීමය. එය මාසයකටත් අඩු කාලයක් තුළ ඉටු කිරීමට රනිල්ට හැකි විය. සියලු පෝලිම් අවසන් විය. මිනිසුන් සුපුරුදු ජීවන රටාවට යොමු විය.

ජනපති රනිල් හමුවේ බරපතලම අභියෝගය වූයේ, බංකොළොත් රට බංකොළොත්භාවයෙන් මුදවාගැනීමය. එහි බැරෑරුම්කම රනිල් රටට ප්‍රකාශ කර සිටියේ, මේ රට ගොඩගන්න නම් වැල් පාලමෙන් එගොඩට යන්න යන්න ඕන. නමුත් හෙළ ගැඹුරුයි, හුනුවටයේ ගෘෂා වැල් පාලමෙන් ගියාට වඩා ගමන දුෂ්කරයි කියාය. මේ රටේ මිනිසුන්ට තේරෙන භාෂාවකින් රනිල් එසේ කියා සිටියේ, ලෝකයේ බංකොළොත් රටවල් ඉන් ගොඩඒමට දැරූ උත්සාහයන්, දුෂ්කරතාවයන් සම්බන්ධයෙන් උගත් පාඩම් ඔහු සතුව තිබූ නිසාය.

2010 වර්ෂයේ බංකොළොත්භාවයට පත් වූ ග්‍රීසියට සිය බංකොළොත්භාවයෙන් ගොඩගැනීමට දශකයකට වැඩි කාලයක් ගත වුණේය. ලෙබනනය, රුවන්ඩාව වැනි රටවල අත්දැකීමට එසේමය. නමුත් ලංකාව මාස 18ක් තරම් කෙටි කාලයක් ඇතුළේ බංකොළොත්භාවයෙන් අත්මිදීමට හැකියාව අත්පත් කරගත්තේය. එය ද ප්‍රචණ්ඩකාරී ආණ්ඩු විරෝධීන්ගේ

> කෙසේ නමුත් වාමවාදී පාර්ශ්වයන් ප්‍රචණ්ඩ අරගල විප්ලව යෝජනා කරන්නේම ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාව තුළ තමන්ගේ ඇති අසමත්කම මතය. එනම් බහුතර ජනතාවකගේ කැමැත්ත ලබාගැනීමට තිබෙන නොහැකියාවය. සුළු පිරිසක් පොළඹවා ගනිමින් සමස්ථ සමාජයම අවුල් වියවුල් කරමින් එදිනෙදා ජන ජීවිතය පවත්වාගෙන යෑමට කිසිවකුට ඉඩ නොදෙමින් රාජ්‍යයේ කටයුතු කඩාකප්පල් කිරීම හරහා බලය පැහැර ගැනීම මේ වාමාංශිකයන්ගේ දේශපාලන තේරීම වෙයි. මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය තුළ තමන්ගේ අපේක්ෂාවන් ගිලිහෙන බව දැනෙන විට DO OR DIE පන්නයේ අරගල උන්මාදයන්, 2024 අරගල වසර කරගැනීමේ වැනි වියරුව මතුවෙයි.

අනේකවිධ බාධා කිරීම් හමුවේය. එසේ නොවන්නට අද වන විට බංකොළොත් නොවන රටක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රකාශයට පත්කොට හමාරය. වරක් ඇමරිකානු ජනාධිපතිව සිටි බැරක් ඔබාමා පවසා සිටියේ, "සාමාන්‍ය මිනිසුන් අසාමාන්‍ය දේවල් කරන නිසා වෙනසක් ඇති වෙනවා." කියාය. රනිල් වික්‍රමසිංහ එවැනි අසාමාන්‍ය කාර්යයන් නොබියව ඉටුකරමින් මේ රටේ සමාජ ප්‍රගමනයට පියවර තැබූ සාමාන්‍ය මිනිසෙකි. එය පසුගිය වසර එකහමාර ඇතුළෙ මේ රටේ සමාජ, ආර්ථික, දේශපාලන ක්ෂේත්‍රයන් තුළ නිර්මාණය කර ඇති වෙනස්කම දකින ඕනෑම අයකු පිළිගන්නා සත්‍යයකි. නමුත් එය පිළිනොගන්නා අයවලුන් යනු හුදු පුද්ගල බද්ධ වෛරී දේශපාලනයක නිරත වන්නන් මිස ප්‍රගතිශීලී සමාජ උන්නතිය විශ්වාස කරන්නන් නොවේ.

### 2024 අරගලය

ලෝකයේ ඕනෑම අරගලයකින්, විප්ලවයකින් පසු ගොඩනැගෙන නව පාලනයකට, ඊට එරෙහිව ඊට සමාන ආකාරයේ ප්‍රතික්‍රියාවන්ට මුහුණ දීමට සිදුවේ. ප්‍රතිඅරගල, ප්‍රතිවිප්ලව ලෙස මේවා මතුවේ. එනම් ආණ්ඩු විරෝධීන්ගේ දරුණු ප්‍රතික්‍රියාවන්ය. බොහෝ විට මේවා අවසන් වූයේ ප්‍රචණ්ඩකාරී, අතිඅමානුෂික අත්දැකීම් සහිත මිනිස් ජීවිතවලින් වන්දි ගෙවා කෙළවර වන ඛේදවාචකයන් ලෙසය.

එහෙත් ලංකාවේ ප්‍රචණ්ඩකාරී අරගල මධ්‍යයේ බලය අත්පත්කරගත් රනිල් වික්‍රමසිංහ පාලනය විසින් ප්‍රචණ්ඩ අරගල යටපත් කිරීමට උපක්‍රමික පියවර ගත් නමුත් ඒ ලේ වැකි මර්දනයක් වූයේ නැත. ඒ විරෝධයන් ඉවසන, ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන, මානව අයිතියට ගරුකරන පාලකයකු වන බැවිනි.

කෙසේ නමුත් වාමවාදී පාර්ශ්වයන් ප්‍රචණ්ඩ අරගල විප්ලව යෝජනා කරන්නේම ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාව තුළ තමන්ගේ ඇති අසමත්කම මතය. එනම් බහුතර ජනතාවකගේ කැමැත්ත ලබාගැනීමට තිබෙන නොහැකියාවය. සුළු පිරිසක් පොළඹවා ගනිමින් සමස්ථ සමාජයම අවුල් වියවුල් කරමින් එදිනෙදා ජන ජීවිතය පවත්වාගෙන යෑමට කිසිවකුට ඉඩ නොදෙමින් රාජ්‍යයේ කටයුතු කඩාකප්පල් කිරීම හරහා බලය පැහැර ගැනීම මේ වාමාංශිකයන්ගේ දේශපාලන තේරීම වෙයි. මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය තුළ තමන්ගේ අපේක්ෂාවන් ගිලිහෙන බව දැනෙන විට DO OR DIE පන්නයේ අරගල උන්මාදයන්, 2024 අරගල වසර කරගැනීමේ වැනි වියරුව මතුවෙයි.

වසර 10 -12ක් තිස්සේ ගොඩගත නොහැකි වූ ලෝකයේ බොහෝ බංකොළොත් රටවල අත්දැකීම ද එයමය. එවැනි රටවල බලකාමී පාර්ශ්ව, පක්ෂ බොහෝ විට ජනතාව මුලා කොට බලය අත්පත් කරගත්තේය. එසේ වුවද ඉතා කොටි කාලයක් තුළ ඔවුන්ටද පෙර සේම අකුලාගෙන යන්නට සිදුවුණේය. විශේෂයෙන්ම වාමාංශික බලවේග විසින් එම රටවල් තිබුණු තැනින් තවදුරටත් ආගාධයටම තල්ලුකර දැමීය. තමන්ගේ බල වුවමණාව සන්තර්පණය කරගත්ත විණා රටේ ප්‍රගමනයට මේ වාමාංශිකයන්ගෙන් කිසිදු සෙතක් වූයේ නැත. බංකොළොත්භාවය යන්න එතරම්ම දරුණු, බැරෑරුම් අගාධයකි. ඉන් ගොඩ ඒමට සුන්දර සිනහා ඇතුළේ කරන සිල්ලර කතාවලින් නොහැකි බව ලෝක අත්දැකීම් තුළින් උකහා ගත යුතුය.

මැල්කම් එක්ස්ගේ සටහනක මෙසේ සඳහන් වේ. එනම් **"ඔබට යථාර්ථයට මුහුණ දිය නොහැකි තරමට දේශප්‍රේමයෙන් අන්ධ විය යුතු නැත. කවුරු කළත් කීවත් වැරැද්ද වැරදියි."** යනුවෙනි.

එහෙත් ජනපති රනිල්ගේ යෝජනාව ද 2024 අරගලයක් කළ යුතු බවය. ඒ ප්‍රජාතන්ත්‍රවාදී අරගලයකි. රට ගොඩනගන අරගලයකි. ආර්ථික ස්ථායිකරණය සහතික කරන අරගලයකි. සමාජ ප්‍රගමනයට පියවර ගන්නා අරගලයකි. වැටුණු වළෙන් ගොඩඑන අරගලයකි. බලකාමී දේශපාලනය පෙරටුකර නොගත් අරගලයකි. අදේශපාලනික ද නොවන අරගලයකි. එය අතිශය සාමකාමී අරගලයකි. ඒ සඳහා පෙර වර්ෂයේ මෙන් තවත් කෙටි කාලයක් දුෂ්කරතා විඳගැනීමට, කැපකිරීම් කිරීමට සූදානම් විය යුතු බවකි. සියලු පූර්වැසියන්ගේ කැපකිරීම්, විඳදරා ගැනීම්වල ප්‍රතිඵලය අනාගත දුවා දරුවන්ටය.

නවන් පතිරත්න

# ව්‍යාපාරික විශ්වාසය ගොඩනගන්නේ කොහොමද?

## මුදල් රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ




මෙරට ආර්ථික වර්ධනය 2023 වසරේ තුන් වැනි කාර්තුවේදී 1.7% ක් වනවා. ඒ අනුව 2023 වසරේ සමස්ත ආර්ථික වර්ධනය -3%ක් පමණ වෙයි. නමුත් 2022 වසරේ දී සමස්ත ආර්ථික වර්ධනය පැවතියේ -11%ක් ලෙස බව පැවසිය යුතුයි. එමෙන්ම ප්‍රාථමික ගිණුමේ ශේෂය තව දුරටත් ධන අගයක පවතිනවා. එහෙත් එය 2022 වසරේ දී පැවතියේ රුපියල් බිලියන 895ක ඍණ අගයකයි. එය 2023 නොවැම්බර් මස වන විට රුපියල් බිලියන 333ක ධන අගයක් වනවා.

ඒ වගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවැනි වාරිකය ලැබීමෙන් අනතුරුව මෙරට විදෙස් සංචිතය ඇමරිකානු ඩොලර් බිලියන 4 ඉක්ම වනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඇමරිකානු ඩොලර් මිලියන 337ක්, ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 220ක් සහ ලෝක බැංකුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 250ක් ලෙෂ ලැබුණා. එමෙන්ම උද්ධමනය තනි ඉලක්කමේ පවත්වාගෙන යාමට අපට හැකි වී තිබෙනවා. 2022 වසරේ උද්ධමනය 70%ක මට්ටමේ පැවතුණා. එය 2024 වසරේ 5% මට්ටමේ පවත්වාගෙන යාමට අපේක්ෂිතයි. එය මෙරට ව්‍යාපාරික ප්‍රජාවේ විශ්වාසය ගොඩ නැගීමට ප්‍රධාන හේතුවක් වෙනවා. ඒ වගේම රාජ්‍ය ආදායම 2023 වසරේ දී රුපියල් බිලියන 3110ක් වනවා. ඒ අනුව 2023 වසරේ සංශෝධිත ඇස්තමේන්තුව බිලියන 2850ක් වනවා. මේ අනුව 2023 වසරේ රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව 11.2%ක් වනවා. 2026 වසරේ දී එය 15% වර්ධනයක් දක්වා රැගෙන යාම අපගේ අපේක්ෂාවයි.

මෙරට බදු ගොනු සංඛ්‍යාවේ වර්ධනයක් සිදුව තිබෙනවා. 2019 වසරේ සමස්ත ලියාපදිංචි බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 1,705,233ක් වුණා. නමුත් විවිධ ප්‍රතිපත්තිමය තීන්දු නිසා එය 2020 වසරේ දී 677,613 දක්වා අඩු වුණා. 2021 වසරේ දී 507,085ක් වුණා. 2022 වසරේ දී 437,547ක් වූ බදු ගොනු සංඛ්‍යාව අද වන විට මිලියනය දක්වා ඉහළ නංවාගැනීමට අප සමත් වී තිබෙනවා.

වත්මන් රජය බලයට පත්වන විට අතැතිව තිබූ රුපියල් බිලියන 350ක වටිනාකම ඉක්ම වූ නොගෙවූ බිල්පත් ප්‍රමාණයක් පැවතුණා. ඒ සියල්ල මේ වන විට ගෙවා අවසන් කර තිබෙනවා. 2023 වසරේ දෙසැම්බර් 15 වන විට සියලු අනුමත ව්‍යාපෘති සඳහා වන බිල්පත් ගෙවා අවසන් කිරීමට ද අප සමත් වුණා. 2024 වසරේ සිට මසකට වඩා වැඩි කාලයක් ගෙවීම් ප්‍රමාද නොකර සිටීමට රජය ප්‍රතිපත්තිමය එකඟතාවකින් කටයුතු කරමින් සිටිනවා. එමෙන්ම 2024 වසර සඳහා අස්වැසුම අයදුම්පත් කැඳවීම ජනවාරි මස අග හෝ පෙබරවාරි මස මුල ආරම්භ කරනවා.

1,410,064 ක අස්වැසුම දෙසැම්බර් මස වාරික මුදලත් ගෙවා අවසන් කිරීමට අපට හැකිවුණා. අපගේ ඉලක්කය ලක්ෂ 20ක් සඳහා මෙම ප්‍රතිලාභ ලබා දීමටයි. 2023 වසරේ පැවැති යම් යම් අඩුපාඩුකම් මගහරවා ගනිමින් ප්‍රතිලාභ හිමි විය යුතුම කණ්ඩායම සොයා ඔවුන්ට ප්‍රතිලාභ ලබාදීමට රජය කටයුතු කරනවා.

# ජනතාවගේ ජීවන බර අඩුවන්නේ කවදාද?



## වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය නලින් ප්‍රනාන්දු

2024 වර්ෂය අප ආරම්භ කරන්නේ ධන ආර්ථික වර්ධන වේගයක් සමගයි. ඒ සමග මෙම වසරේ පළමු කාර්තුව අවසන් වන විට ජනතාවගේ ජීවන බර 75% කින් අඩුවන බව සඳහන් කළ යුතුයි. පවතින බදු ප්‍රතිපත්තිය නිසා ඉදිරියේදී ජනතාවට තවත් සහන රැසක් ලැබෙන බවට ද අපට සහතික විය හැකියි.

ඒ වගේම රාජ්‍ය ආදායම ඉහළ නංවාගැනීම වෙනුවෙන් බදු අයකිරීම වැරදි බව ඇතැමුන් පවසනවා. නමුත් එවැනි ප්‍රකාශ සිදුකරන්නන් රටේ ආර්ථිකය වර්ධනය වනවාට එරෙහි වන්නන් බව පැවසිය යුතුයි. රටේ අනාගතය වෙනුවෙන් ආයෝජන කරන්නේ රජයට ලැබෙන බදු ආදායමෙන් නම් ඒ සඳහා සහයෝගය දැක්වීම සමස්ත ජනතාවගේම වගකීමක් වනවා.

තවද ඇතැමුන් බදු බර වැඩි බව පවසමින් රට හැර යනවා. නමුත් මෙරට බදු අය කිරීම සිදු කෙරෙන්නේ 12% ක මට්ටමකින්. එහෙත් රට හැර යන පිරිස් ආකර්ශනය වී ඇති රටවල බදු ප්‍රතිශතය 38% සිට 43%ක පමණ මට්ටමක ඉහළ අගයක පවතිනවා. එම රටවල්වල සංවර්ධනය වී තිබෙන්නේ එවැනි බදු ප්‍රතිපත්තියක් අනුගමනය කරන නිසයි. ඉන්දියාව ළූණු අපනයනය නැවැත්වීම නිසා එහි පීඩනය අපේ රටට ද බලපා තිබෙනවා. නමුත් ඉන්දියාව ඊළඟ සති දෙක තුළ ළූණු අපනයන සීමා ලිහිල් කිරීමෙන් පසු එම ගැටළුව විසදෙන බව ද සඳහන් කළ යුතුයි.

කෙසේ වෙතත් අපට සිදුව ඇති හානිය වන්නේ, වැට් ඇතුළු බදු සංශෝධන සම්බන්ධයෙන් කිසිදු අධ්‍යයනයක් සිදු නොකොට ඇතැම් පාර්ශ්ව විවිධ ක්‍රම ඔස්සේ අනිසි ප්‍රචාරයක් ලබාදීමයි. මේ තත්ත්වය තුළ අතරමැදියන් සහ ඇතැම් සමාගම් හිතුමතේ මිල ගණන් ඉහළ දමා ජනතාවට පීඩනයක් එල්ල කර තිබෙනවා.

2024 වසරේ මුල් කාර්තුව තුළ ලංකා සතොසට නවතම මෙගා (පැට්) අලෙවිසැල් 05ක් හා සාමාන්‍ය ලංකා සතොස අලෙවිසැල් 10ක් ආරම්භ කිරීමට යෝජිතයි. ඒ වගේම මෙම වසර අවසාන වන විට ලංකා සතොස අලෙවිසල් ජාලය අලෙවිසල් 500ක් දක්වා පුළුල් කිරීමට ද සැලසුම් කර තිබෙනවා.

සමස්ත අලෙවිසැල් ජාලය අලෙවිසැල් 500 දක්වා වර්ධනය කිරීම තුළින් පාරිභෝගිකයන් සඳහා හිඟයකින් තොරව රජයේ සහන මිලට භාණ්ඩ මිලදී ගැනීමට අවස්ථාව සලසා දීම මෙම අලෙවිසල් ජාලය ව්‍යාප්ත කිරීමේ ප්‍රමුඛ පරමාර්ථය වනවා.

තවද, 2024 වසරේදී ලංකා සතොස සමාගමේ මුළු ආදායම රුපියල් බිලියන 70ක ආසන්නයකට ගෙන ඒමටත්, එමගින් සමස්ත මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 1.5 කට ආසන්න ප්‍රමාණයක් දක්වා ගෙන ඒමටත් සැලසුම් කර තිබෙනවා. ඒ වගේම රටේ පවතින ආර්ථික අභියෝග හමුවේ ආයතනයේ ශුද්ධ ලාභය රුපියල් මිලියන 500ක් දක්වා සුරක්ෂිත කරගැනීමට ද සැලසුම් කොට තිබෙනවා.

# දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය වැට් බද්දෙන් නිදහස්ද?

## දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය නීතිඥ සිසිර ජයකොඩි




දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ විශාල ජයග්‍රහණ රැසක් ලබා ගැනීමට මේ වන විට අප සමත් වී තිබෙනවා. ආයුර්වේද නිෂ්පාදන, ඖෂධ සහ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ කර්මාන්ත වැට් බද්දෙන් නිදහස් කිරීම සඳහා රජය තීරණය කර තිබෙනවා. එමගින් සෞඛ්‍ය සේවයේ වියදම් අවම කිරීමට හැකියාව ලැබී තිබෙනවා.

පාරම්පරික වෛද්‍ය ක්‍රමය සුරක්ෂිත කිරීමට විශේෂ කාර්යාංශයක් පිහිටුවීමට කැබිනට් අනුමැතිය හිමි වී තිබෙනවා. පාරම්පරික වෛද්‍ය ක්‍රමය වෙනුවෙන් විධිමත් ආයතනයක් ගොඩනගන තෙක් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පාරම්පරික වෛද්‍යවරුන්ට බලපාන ගැටලු විසදාගැනීම සඳහා මෙම විශේෂ කාර්යාංශය පිහිටුවනවා. ලියාපදිංචි වූ සහ ලියාපදිංචි නොවූ වෛද්‍යවරුන් සඳහා නිසි පිළිගැනීමක් ඇති කිරීම, එම වෛද්‍ය ක්‍රමය පිළිබඳව අධ්‍යයනයන් සිදුකිරීම සහ නිසි ක්‍රමවේදයක් සකස් කිරීම මෙන්ම එම වෘත්තීය සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම එමගින් සිදුකිරීමට නියමිතයි.

ඒ වගේම ආයුර්වේද සංස්ථාව මූලික වෙමින් ආයුර්වේද සුව සත්කාරක මධ්‍යස්ථාන (බොඩි මන්ත්‍ර) දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට හඳුන්වා දෙනවා. මෙමගින් දේශිය වෛද්‍ය ක්ෂේත්‍රයේ පරිවර්තනීය වෙනසක් සිදුවනු ඇතැයි අප විශ්වාස කරනවා. උපාධිධාරී පුහුණු සම්භාහකයින්ගේ අධීක්ෂණය යටතේ ශාරීරක සුව සත්කාරක සේවය ඇති කිරීම සඳහා වූ ක්‍රියාමාර්ගය ආයුර්වේද සුව සත්කාරක මධ්‍යස්ථාන හරහා සිදු කිරීමට නියමිතයි.

මෙය දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් ද ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. දේශීය වශයෙන් හෝටල් සහ සංචාරක ක්ෂේත්‍රයේ නිරත වන සියලුම ආයතනවලට මේ සඳහා ලියාපදිංචි වන ලෙස අප ආරාධනා කර සිටිනවා. ඒ පිළිබඳ පුවත්පත් දැන්වීම මේ මස 10 වනදා නිකුත් කෙරෙනවා. එමෙන්ම මෙම වසර අවසාන වීමට පෙර දේශීය ඖෂධ නිෂ්පාදනය සහ වගා කිරීම වාණිජ කර්මාන්තයක් ලෙස නගාසිටුවීමට බලාපොරොත්තු වනවා. එය මේ දක්වා පැවතුණේ යැපුම් මට්ටමින් වන අතර මින් ඉදිරියට වාණිජ මට්ටමින් සිදු කිරීමට අප සූදානම් බව සඳහන් කළ යුතුයි.

දකුණේ වැසි සහිත කාලගුණයට අදාළව වී වගා කෙරෙනවා. එම තත්ත්වය මත අපට අස්වැන්න ලබාගත හැක්කේ එක් වතාවක් හෝ දෙවතාවක් පමණයි. නමුත් වී වගාවට සමාන්තරවම තිප්පිලි ද වගා කළ හැකියි. එය එකම දේශගුණික සහ පාරිසරික තත්ත්වය මත කන්න හතරකට ලබා ගැනීමේ හැකියාව පවතිනවා.

වී කිලෝ එකක් රුපියල් 150 හෝ 200ක් වන අතර තිප්පිලි කිලෝ එකක් රුපියල් 9000කට අලෙවි කිරීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා සාම්ප්‍රදායික වගා ක්‍රම වෙනුවට වාණිජමය වගාව කෙරෙහි යොමු කිරීමට ද අප සූදානම් බව සඳහන් කළ යුතුයි. දේශීය වශයෙන් අමුද්‍රව්‍ය අප රට තුළම නිෂ්පාදනය කරගැනීම මෙහි තවත් අරමුණක් වනවා.

සටහන
අසන්ත බණ්ඩාර

# බිලියන දෙකක ජනතාවකට කලාපයේ ඉරණම භාර දෙන

මෙම කලාපයට අභියෝග කිහිපයක් ලබා දෙමින් 2024 නව වර්ෂය අරම්භ විය, බංග්ලාදේශය, පකිස්ථානය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව නියෝජනය කරන දකුණු ආසියාවේ බිලියන දෙකකට ආසන්න ජනතාවක් තීරණාත්මක මැතිවරණ මාලාවකට මෙම වසරේදී සූදානම්වීම කලාපිය දේශපාලනය තුළ විශේෂත්වයකි.

මෙම මැතිවරණ පැමිණෙන්නේ දේශපාලන එදිරිවාදිකම්, ආර්ථික අර්බුද සහ බලය ලුහුබැඳීම වැනි ඔවුන්ගේ අද්විතීය අභියෝග සමූහයක් සමගිනි.

මෙම රටවල් පසුගිය ශත වර්ෂය තුළ සමාන කාලයක් තුළදී බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබා ගත් පැරණි යටත්විජිත වීමත් පසු යටත්විජිත සමයේ සමාන අභියෝග යන් රැසකට මුහුණ දුන් රටවල් වීමත්ය.




## 2024 ඡන්ද සටන

### බංග්ලාදේශය

මිලියන 170ක ජනගහනයක් සිටින බංග්ලාදේශය ජනවාරි 7 වැනිදා මැතිවරණ සමය ආරම්භ කරයි. අගමැතිනි ෂේක් හසීනාගේ නායකත්වයෙන් යුත් ජාතියේ පාලක අවාමි ලීගය, විසම්මුතිය යටපත් කිරීම සහ රට ඒකපාර්ශ්වික රාජ්‍යයක් කරා මෙහෙයවීමේ චෝදනාවලට මුහුණ දෙයි. මැතිවරණයේ සාධාරණත්වය පිළිබඳ කනස්සල්ල නොතකා, හසීනා අඛණ්ඩව සිව්වන වාරය ලබාගැනීමට සූදානමින් සිටී. බංගලාදේශ ජාතිකවාදී පක්ෂයේ (BNP) Khaleda Ziaගේ නායකත්වයෙන් යුත් ප්‍රධාන විපක්ෂය අභියෝගවලට මුහුණ දෙන අතර Zia නිවාස අඩස්සියේ ජීවත් වේ. මෙම තත්ත්වය විරෝධතාවයට තුඩු දී ඇති නමුත් මැතිවරණය වර්ජනය කිරීමට BNP තීරණය කිරීම, හසීනාගේ අඛණ්ඩ පාලනයට මග පාදයි.

ආර්ථික වශයෙන්, බංග්ලාදේශය වර්ධන මාවතක ගමන් කරන අතර එය මූලික වශයෙන් ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය විසින් මෙහෙයවනු ලබයි. එහි දළ දේශීය නිෂ්පාදිතයට ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය සැලකිය යුතු දායකත්වයක් සපයයි. දේශපාලන අස්ථාවරත්වය තිබියදීත් 2031 වන විට බංග්ලාදේශය මැදි ආදායම් තත්වය ළඟා කර ගැනීම ජාතියේ අරමුණයි.








### පකිස්ථානය

වසර 76ක් පුරා පකිස්තානය ප්‍රභල පවුල් හෝ හමුදාව විසින් මෙහෙයවනු ලැබූ අතර, තේරී පත් වූ කිසිදු නායකයෙකු වසර පහක පූර්ණ ධූර කාලයක් සේවය කර නැත. මිලියන 230ක ජනගහනයක් සිටින රට දේශපාලන ප්‍රශ්න, සටන්කාමීන්ගේ ප්‍රහාර සහ බරපතල ආර්ථික අර්බුදයකට මුහුණ දී ඇත. ජනප්‍රිය හිටපු අග්‍රාමාත්‍ය ඉම්රාන් ඛාන් වංචා සහ රාජ්‍ය රහස් චෝදනා හේතුවෙන් මේ වන විට සිරගතව සිටින අතර ඔහුට ඉදිරි මැතිවරණයට සම්බන්ධ වීම වළක්වයි.

රූපවාහිනී නාලිකාවලට ඔහුගේ කතා විකාශය කිරීමට අවසර නැත. ඔහුගේ පාක්ෂිකයන් බොහෝ දෙනෙක් අත්අඩංගුවට ගෙන ඇත. මේ අතර, හිටපු අගමැති නවාස් ෂරීෆ් පකිස්තානයේ දේශපාලන වේදිකාවට තවත් ආතතියක් එක් කරමින් ස්වයං පිටුවහලේ සිට ආපසු පැමිණ තිබේ. රට ආර්ථික අවිනිශ්චිතතාවයන්ට, නිරන්තර සටන්කාමී ප්‍රහාර සහ දේශගුණික විපත්වලට ද මුහුණ දෙයි. මෙම තත්ත්වය දේශපාලන සහ ආර්ථික ස්ථාවරත්වයට බලපාන නව නායකයින් සඳහා දැඩි මාවතක් ඉදිරිපත් කරයි.

### ඉන්දියාව

බොහෝ විට ලෝකයේ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හැඳින්වෙන ඉන්දියාව වසන්තයේ දැවැන්ත මැතිවරණයකට සූදානම් වෙමින් සිටී. අගමැති නරේන්ද්‍ර මෝදි තෙවැනි වරටත් බලයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

භාරතීය ජනතා පක්ෂයේ (BJP) නායකයා වන මෝඩි, ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන කෙරෙහි සිය පාලනයේ බලපෑම ශක්තිමත් කර ඇති අතර, හිටපු අගමැතිනි ඉන්දිරා ගාන්ධි අත්තනෝමතිකත්වයට නැඹුරු වෙමින් දැඩි හස්තයකින් පාලනය කළ 1970 දශකය සිහිපත් කරයි.

ගෝලීය වේදිකාවේ ඉන්දියාව වෙන කවරදාටත් වඩා වැදගත් ය. මේ වසරේ ඕස්ට්‍රේලියාවේ සහ එක්සත් ජනපදයේ සංචාරය කළ මෝඩි, ඉන්දියාව නූතන සුපිරි බලවතෙකු ලෙස ශක්තිමත් කරන රාජ්‍ය නායකයෙකු ලෙස තමා නිරූපණය කරයි.

2023 ඉන්දියාවේ බිලියන 1.4ක ජනතාවට අසාමාන්‍ය වසරක් විය. ඉන්දියාව චීනය අභිබවමින් ලොව වැඩිම ජනගහණයෙන් යුත් රාජ්‍යය බවට පත් වූ අතර, ඊට පෙර වසරේ එහි හිටපු යටත් විජිත පාලකයා වූ බ්‍රිතාන්‍යය අභිබවා යමින් පස්වන විශාලතම ආර්ථිකය බවට පත් විය.

අගෝස්තු මාසයේදී ඉන්දියාව සඳ මත මෘදු ගොඩබෑමකින් ඉතිහාසගත වූ අතර ඉන් ටික කලකට පසු සූර්යයා අධ්‍යයනය කිරීමට කැප වූ එහි පළමු අභ්‍යවකාශ යානය දියත් කළේය.

සැප්තැම්බර් මාසයේදී G20 සමුළුවට සත්කාරකත්වය සැපයීමට ලැබීම, වැඩෙන දේශපාලන නොසන්සුන්තාවක් පවතින අවස්ථාවක දේශසීමාවෙන් ඔබ්බට නායකත්වය පෙන්වීමට මෝඩි පාලනයට අවස්ථාවක් ලබා දුන්නේය.

කෙසේ වෙතත්, විචාරකයින් තර්ක කරන්නේ, කලක සිට භාරතීය ජනතා පක්ෂයේ බහුතර ප්‍රතිපත්ති යටතේ ඉන්දියාවේ ලෞකික හා ප්‍රජාතන්ත්‍රවාදී පදනම වේගයෙන් පිරිහෙමින් පවතින බවයි. සුළු ජාතීන්ට හිංසා පීඩා දැනෙන අතර, ආණ්ඩුව පිළිබඳ ඕනෑම විවේචනයක් වාරණයකට සහ දැඩි දඬුවම්වලට මුහුණ දෙයි.

මෝඩිගේ ප්‍රතිවාදියා වන්නේ ප්‍රධාන විපක්ෂය වන ඉන්දීය ජාතික කොංග්‍රසය ඇතුළු දේශපාලන පක්ෂ 26 කින් සමන්විත, අලුතින් පිහිටුවන ලද INDIA සන්ධානයය. මෑත කාලීන ඡන්දවලදි කොන්ග්‍රස් පක්ෂයට දෙසැම්බර් මාසයේ පැවති ප්‍රධාන ප්‍රාන්ත මැතිවරණවලදී ප්‍රාදේශීය ඡන්ද හතරෙන් තුනක් අහිමි වූ අතර, එය මෝඩිට සහ භාරතීය ජනතා පක්ෂයට වාසියක් ලබා දුන්නේය.

### ශ්‍රී ලංකාව

දැඩි ආර්ථික අර්බුදයකින් මිදී සිටින ශ්‍රී ලංකාව සැප්තැම්බර් මාසයට පෙර මැතිවරණයක් අපේක්ෂා කරයි. ගෝඨාභය රාජපක්ෂ බලයෙන් පහකළ පසුව ජනාධිපති ධූරයට පත් රනිල් වික්‍රමසිංහ සිය දෙවන ධූර කාලයක් සඳහා අපේක්ෂකත්වය ලබාගැනීමට සිදුවෙනු ඇත.

රටේ ආර්ථික දුෂ්කරතා මැතිවරණය ප්‍රමාද කළ නමුත් ප්‍රතිසංස්කරණ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය ආධාර යළි රට ප්‍රකෘතිමත් වීමේ මාවතක් සළකුණු කර ඇත. ශ්‍රී ලංකාව අනාගතය දෙස බලන විට ඉදිරි මැතිවරණ එහි ගමන් මග තීරණය කිරීමට දැඩි බලපෑමක් කරනු ඇත.

කෙසේ නමුත් මෙම වසර පටන් ගැන්මම සිත් ඇදගන්නා සුලු ප්‍රජාතන්ත්‍රවාදී සංදර්ශනයක් සඳහා වේදිකාව සකසා ඇත. මෙම පැරණි යටත්විජිතවලින් බිලියන 2කට ආසන්න ජනතාවක් ඡන්දය ප්‍රකාශ කරන බැවින් සියල්ලගේ අවධානය යොමු වී ඇත්තේ ඓතිහාසික, අනපේක්ෂිත සහ පරිවර්තනීය බවට පොරොන්දු වන වසරක් වෙතය.

නිරෝෂන් පෙරේරා

# ඉන්න හිතෙන රටක් ඕන නම් බදු ගෙවන්නම ඕනෙ



රටක් කියලා කිව්වාම ඒක උඩරට, පහතරට, මැදරට, රජරට වගේ ප්‍රදේශීය සීමා තුළ කරන නාමකරණයක් නෙවෙයි. මේ දූපතේ සීමාවන් ඇතුළට වෙලා ලෝකෙන් උතුම් රට මේකයි කිව්වාට මේක එහෙම රටක් වෙන්නෙත් නැහැ.

රටක් කියන එකට තියෙන පිළිගත්තු නිර්වචනය වෙන්නේ ස්වාධිපත්‍යය සහිත රාජ්‍යයකට අයත් භූමිය කියලා සැලකෙන බිම්කඩ. රාජ්‍යය කියන්නේ ඒ බිම්කඩේ, ඒ කියන්නේ ඒ රටේ, මෙච්චර මිනිස්සු ගණනක් ඉන්නවාය කියන්න පුළුවන්, ඒක පාලනයට ආණ්ඩුවක් තියෙන, ස්වාධිපත්‍ය බලය ඇති සංවිධානයකට. මේ ස්වාධිපත්‍ය බලය රටේ ඉන්න මිනිස්සු හදාගන්න ඕන. රාජ්‍යය කියන්නේ ඒ රටේ වාසය කරන හැම මිනිහෙකුම එකට එකතු වෙලා හදාගත් පොදු සංවිධාන සම්මුතියක් නිසා, මිනිස්සු සතු සමස්ත බලයම රාජ්‍යයට ලැබෙනවා... ඒක මූලික වුත්, අසහාය වුත්, උත්තරීතර වුත් බලයක්. ස්වාධිපත්‍ය බලය කියන්නේ ඒකට.

ස්වාධිපත්‍ය ඇති රාජ්‍යයක තියෙන්නේ පොදු අරමුණු සහ පොදු පරමාර්ථයන්. මුළු සමාජයේම නැතිනම් පුරවැසියන් සියළු දෙනාගේම යහපත සැලසීම රාජ්‍යයේ අවසාන පරමාර්ථයයි. රාජ්‍යයට නීති ඕන වෙන්නේ මේ නිසයි. ආර්ථික, දේශපාලන හරි සමාජ හරි ප්‍රතිපත්ති එක්ක වැඩකරන්නේ මේ පොදු වුවමණාවන්ට ගැලපෙන විදිහට.

දැන් මේ කියන රාජ්‍යයේ වැඩ ටික කරගෙන යන්න නම් මිනිස්සුට පාලන ක්‍රමයක් හදාගන්න වෙනවා... ඒකට රජය කියල කියනවා... ඒක පාලනය කරන කට්ටියට ආණ්ඩුව කියනවා. ඒත් රජයක් තිබුණු පළියට, ආණ්ඩුවක් තිබුණු පළියට රාජ්‍යය පාලනය කරන්න බැහැ. ඒකටත් වෙන්න ඕන තව දේවල් තියෙනවා..

මේ කාලය වෙනකොට රජයක් නැතිනම් ආණ්ඩුකරන කට්ටිය, රාජ්‍යයේ පරමාර්ථ ටික ජයගන්න ඉතිහාසය පුරා කරපු කියපු දේවල් බොහොමයි. මුදල් කියන දේ භාවිතයට ආවට පස්සේ මේ වැඩ කරගන්න රජයට මුදල් ඕන වුණා... මේ මුදල් හොයාගන්න එක කරන්න වෙන්නේ කොහොමද කියන එක තමා මේ රාජ්‍ය ඉතිහාසය මුළුල්ලේම හැමදාමත් තිබුණු ගැටළුව.

ඒත් රජයට විතරයි අයිතියක් තියෙන්නේ තමන්ගේ රටට ඕන මුදල් නිෂ්පාදනය කරලා මුදා හරින්න. ඒ කියන්නෙ සල්ලි අච්චු ගහන්න. ඒකටත් සීමාවක් තියෙනවා. සීමාව පැනලා ගියාම වෙන දේ මේ රටේ අපි තාමත් අත් විඳිනවා. කොහොම හරි රජය කළේ සල්ලි අච්චු ගහලා ඒ සල්ලිවලින් භාණ්ඩ හා සේවාවන් ගන්න එක. ඒවා මිලදී ගන්න නම් මිනිස්සු ඒ දේවල් නිෂ්පාදනය කරන්න ඕන. භාණ්ඩ හෝ සේවාවන් විකුණලා සල්ලි හම්බ කරගන්න මිනිස්සුන්ට පුළුවන් වුණා. රජය සල්ලි දීලා ගත්තු දේවල් ඒවා නිෂ්පාදනය නොකරන මිනිස්සුන්ට විකුණනවා. රාජ්‍ය සේවය කියන්නේ එහෙම එකක්. රජයත් ඒකෙන් ලාභයක් හරි පාඩුවක් ගන්නවා වෙන්න පුලුවන්. ලොකු ලාභයක් ගන්න පුලුවන් නම් රජයට සල්ලි එකතු වෙනවා භාණ්ඩාගාරයේ. පාඩු වුණොත් රජය බංකොලොත් වෙනවා. ඒත් රජයට ලොකු ලාභ ගන්නවත් පාඩු ගන්නවත් බෑ. රාජ්‍යය පිහිටුවීමේ අරමුණම ඒක නෙවෙයි. කොහොමත් ලාභ ගන්න හිතාගෙන රජයන් ව්‍යාපාරික වැඩ කරන්න ගිහින් රාජ්‍යය පවත්වගෙන යන්න බැරුව ඕන තරම් කඩා වැටිලා තියෙනවා. ඒ වගේම පාඩු නිසාත් කඩා වැටීම තමයි වුණේ. දැන් මේ අපේ රටට වෙලා තියෙන්නෙත් ඒකම තමයි. රජය ව්‍යාපාර කිරිල්ලෙන් අයින්වෙන්න ඕන කියල හේතු තොගයක් ගැන කතා වෙන්නේ ඒකයි.

රජයකට ව්‍යාපාර කරලා ගොඩයන්න බැරි නිසා තමයි රටේ දේවල් නිෂ්පාදනය කරලා සල්ලි හොයන අයගෙන් බදු අය කරන්නේ. සල්ලි හොයන අයට රජය ලබාදෙන විවිධ සේවාවන් වෙනුවෙන් සහ අනාගත සේවාවන් වෙනුවෙන් ඕන කරන වියදම් රජය හොයාග න්නේ බදුවලින්. බදු අය කරගැනීම ප්‍රතිපත්ති අසාධාරණ අසාධාරණ බව කොහොම වුණත් බදු නැතුව දැන් රජයක් කරගෙන යන්න බැහැ.

ව්‍යාපාර නොකර බදුවලින් ආදායම් හොයාගන්න එක රජයට ලොකු වාසියකුත් වෙනවා. මොකද රජය ව්‍යාපාර කරන්න ගිහින් වැය කරන්න සිදුවෙලා තිබ්බ මහා ධනස්කන්ධය ඉතිරි වෙනවා. පාඩු ලබන දේවල් නඩත්තුවට නිස්කාරණේ වියදම් කරපු සල්ලි ඉතිරි වෙනවා. දූෂණ වංචා වගේ දේවලුත් අඩු වෙනවා. මේ වියදම් කියන්නේ මිනිස්සුගෙන් එකතු කරගත්තු බදු මුදල්.

මෙහෙම රාජ්‍ය ආදායමට වැඩි එකතුවක් වෙනකොට ඒ සල්ලිවලින් රාජ්‍යයේ පරමාර්ථ ජයගන්න වැඩි අවස්ථාවක් ලැබෙනවා. මිනිසුන්ගේ පහසුකම් ගොඩනගන්න පුළුවන්. රටේ සංවර්ධනයට ඕන කරන දේවල්වලට වැඩිපුර වියදම් කරන්න පුළුවන්. ඒ වගේම ඕනම රටක නිෂ්පාදනය එක්ක සම්බන්ධ වෙන්න බැරි, හැකියාවන් නැති අසමත් කට්ටිය ඉන්නවා. දරිද්‍රතාවයට පත් වෙච්ච අය. ආබාධිත අය වගේ කට්ටිය බලාගන්න එකත් රජයට කරන්නම වෙනවා. රජයක් කියල එකක් හදාගත්තේ මේවා කරන්නත් එක්කම තමා. ඉතිං මේවට වියදම් කරන්නත් සල්ලි ඕන. ඒ කියන්නේ බදු අය කරගන්න ඕන. මේක මෙහෙම වෙනකොට, අපි බදු ගෙවනවා කියන්නේ රාජ්‍යයේ පරමාර්ථ ඉෂ්ඨ කරන්න දායකවෙනවා කියන එකයි.

සමහරු මේ රට අත්ඇරලා ගියා, මේක ඉන්න හිතෙන රටක් නෙවෙයි කියලා. හැබැයි ඒ අය මේක ඉන්න හිතෙන රටක විදිහට හදාගන්න උදව් කරලත් නෑ. එහෙම උදව් කළා නම් රට අත්හැරල යන්න වෙන්නේ නෑ.

රටේ ගොඩක් අය හිතාගෙන ඉන්නේ රජය තියෙන්නේ තමන්ව බලාගන්න කියලා. නෑ.., රජය කියන්නේ පොදු වුවමණාවක් වෙනුවෙන් හැමෝම එකතුවෙලා හදාගත්ත දෙයක්. තමන්ට දෙයක් ලැබෙන්න ඕන ඒ පොදු වුවමණාව ඉෂ්ඨ වෙනකොට. ආණ්ඩුවක් වුණත් වැඩකරන්න ඕන ඒ අවබෝධයෙන්. හැබැයි රජය වෙනුවෙන් තමන්ගෙන් වෙන්න ඕන දේ ගොඩක් මිනිස්සු කරන්නේ නෑ. කොටින්ම බදු ගෙවන්න වෙන එකටත් ලොකුවටම විරුද්ධයි. බදු ගෙවන්න විරුද්ධ වෙන මිනිහෙක් කියන්නේ, කොහොමටවත් මේ රට වෙනුවෙන් දෙයක් කරන තියා එහෙම හිතන්නෙවත් නැති කෙනෙක්.

රාජ්‍යයක් කියල දෙයක් හදාගත්තා නම්, ඉන්න හිතෙන රටක් හදාගන්න ඕන නම්... අනිවාර්යෙන්ම තමන්ගේ තරමට බදු ගෙවන්නම වෙනවා. ඒක ස්වාධිපත්‍යය එක්ක බැඳිච්ච වගකීමක්.

ලොකු

පිටකෝට්ටේ, මිෂන් පාර, අංක 19/5/ඒ දරණ ස්ථානයේ පදිංචි කේ.පී.අයි. ප්‍රියංගනී වන මා විසින් උඩහමුල්ල, විජේරාම මාවගේ පිහිටි TDL මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී